වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2020




ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்

NATIONAL FILM CORPORATION OF SRI LANKA

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව



වාර්ෂික වාර්තාව

2020

<u>පිළිගැන්වීම</u>

දිනය - 2021.08.

මගේ අංක NFC/119/02/01/01

ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින්

ගරු අග්‍රාමාත්‍ය හා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමා
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල
සෙත්සිරිපාය
බත්තරමුල්ල

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - වාර්ෂික වාර්තාව -2020</u>

1980 අංක 45 දරණ පනතින් සංශෝධිත 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛනයන් ද සමග සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2020 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාල ප්‍රකාශ
2. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සංස්ථාවේ ලාභලාභ ගිණුම්, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව

මෙයට විශ්වාසී වූ

රවි ප්‍රසාද් කලුපහන
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

අත්සන් කළේ - ජයන්ත ධර්මදාස
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

පාලන වාර්තාව

01. හැඳින්වීම

02. අධ්‍යක්ෂ මණ්ඩලය

03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

04. පිරිස් හා ආයතන පාලනය

05. චිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩ්ස්

06. අභ්‍යන්තර විගණන කටයුතු

07. සිනමා සංස්කෘතිය හා අධ්‍යාපන කටයුතු

08. චිත්‍රපට ප්‍රදර්ශනය

09. දේශීය සැපයුම් - ආනයන හා අපනයන

10. මූල්‍ය කටයුතු

11. නෛතික කටයුතු

12. චිත්‍රාගාරය

13. විමර්ශන කටයුතු

14. සැලසුම් සංඛ්‍යාලේඛණ හා පුහුණු

15. වෛද්‍යාධාර

16. සුභ සාධනය

17. ආගමික කටයුතු

18. ක්‍රීඩා සංගමය

19. වෘත්තීය සමිති

20. ස්තූතිය

01. හැදින්වීම

1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කල 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ ගරු අග්‍රාමාත්‍ය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2020 වර්ෂය පිළිබඳ වාර්තාව.

2020 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 49 වන ක්‍රියාත්මක වර්ෂයට අදාල වේ.

02. අධ්‍යක්ෂ මණ්ඩලය

2020 වර්ෂය තුළ ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පහත නම් සඳහන් සමාජිකයින්ගෙන් සමන්විතව ඇත.

	නම	තනතුර /ක්ෂේත්‍රය	සංයුතිය
1	ආචාර්ය ජයන්ත ධර්මදාස	සභාපති - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත - 7(1) (ආ) සහ 19(1) වගන්තිය - අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන
2	නාලක කළුවැව මහතා	ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත - 7(1) (අ) වගන්තිය - නිල බලයෙන්පත් වනු ලබන
3	තරණි අනෝජා ගමගේ මහත්මිය	සංස්කෘතික අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	
4	චන්ද්‍රපාල ලියනගේ මහතා	අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	
5	රොහාන් වැලිවිට මහතා	ක්‍රියාකාරී අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව (2020.01.01 සිට 2020.05.12 දින දක්වා)	1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත - 7(1) (ආ) වගන්තිය - අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන
	එස් .ටී. කොඩිකාර මහතා	(2020.10.15 දින සිට)	
6	ආචාර්ය ධම්මික දිසානායක	කථිකාචාර්ය - සෞන්දර්ය විශ්වවිද්‍යාලය	
7	ආචාර්ය රවීන්ද්‍ර රන්දෙණිය	සිනමා කර්මාන්තය	
8	ධම්මිත් පොන්සේකා මහතා	සිනමා කර්මාන්තය	
9	වසන්ති චතුරානි මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිරීක්ෂක)	
10	ඩී. සී. ජයදේව මහත්මිය	භාණ්ඩාගාර නියෝජිත - අධ්‍යක්ෂ - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	

❖ ජනාධිපති ලේකම්ගේ 2020.01.13 වන දිනැති චක්‍රලේඛ අංක.PS/SP/Circular/02/2020 පරිදි සියලුම රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර අහෝසි වූ බැවින්, රොහාන් වැලිවිට මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීම 2020.05.12 දින සිට අවසන්ව ඇත.

❖ 2020.10.15 දින සිට අමාත්‍යාංශ ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් නැවත පත්කිරීමක් කර ඇති අතර, එහිදී පහත සඳහන් සාමාජිකයින් ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කර ඇත.

1. එස්.ටී.කොඩිකාරමහතා - ලේකම්, ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු අමාත්‍යාංශය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
2. ආචාර්ය මාලනී ෆොන්සේකා මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිරීක්ෂක)

❖ ඒ අනුව, එස්.ටී. කොඩිකාර මහතා 2020.11.25 දින පවත්වන ලද 1194 වැනි විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සිට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වී ඇත. ආචාර්ය මාලනී ෆොන්සේකා මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිරීක්ෂක) තනතුර භාර නොගන්නා බව 2021.01.05 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත.

❖ 2020.10.15 දින අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීමේදී වසන්ති චතුරානි මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිරීක්ෂක) වශයෙන් පත් කර ඇත.

03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

	විස්තරය	ප්‍රගතිය(රු. ශත)
01.	<u>දේශීය චිත්‍රපට ලියාපදිංචි කිරීම</u> **චිත්‍රපට සංඛ්‍යාව - 18** (එක් චිත්‍රපටයක් වෙනුවෙන් රු. 5000.00 ක මුදලක් ලියාපදිංචි ගාස්තු වශයෙන් අය කරනු ලැබේ) චිත්‍රපටයන්හි නාමය වෙනස් කිරීම වෙනුවෙන් අයකිරීම් **- 04** (එක් චිත්‍රපටයක් සඳහා රු. 3000.00 බැගින්)	**90,000.00** **12,000.00**
02.	චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය. • <u>**විශ්‍රාම වැටුප් ගෙවීම.**</u> (එක් අයෙකුට රු. 5,000.00 බැගින්) I. ජනවාරි - 153දෙනෙකු සඳහා, II. ජනවාරි - නව විශ්‍රාම වැටුප්ලාභී 10 දෙනෙකු සඳහා, III. පෙබරවාරි - අප්‍රේල් - 163 දෙනෙකු සඳහා, IV. මැයි - 162 දනෙකු සඳහා, V. ජුනි සිට ජුලි - 161 දෙනෙකු සඳහා, VI. අගෝස්තු සිට දෙසැම්බර් දක්වා 160 දෙනෙකු සඳහා, • මරණාධාර ගෙවීම් (එක් අයෙකුට රු. 10,000.00 බැගින්) **i.** නිශාන්ත ද අල්විස් මහතා	**765,000.00** **50,000.00** **2,445,000.00** **810,000.00** **1,610,000.00** **4,000,000.00** **9,680,000.00** **10,000.00**

03.	සුවිශේෂී කලාකරුවන් වෙනුවෙන් : • **<u>වෛද්‍යාධාර ගෙවීම</u>** i. තිස්ස සුරේන්ද්‍ර මහතා ii. ඇන්ජලා සෙනෙවිරත්න iii සුරේනි සෙනරත් මෙනවිය iv. ප්‍රියංකර පෙරේරා මහතා v. මියුරි සමරසිංහ මහත්මිය } එක් අයෙකුට රු. 50,000.00 බැගින් ගෙවීම් කර ඇත. • **<u>මරණාධාර ගෙවීම</u>** i. ජයලත් මනෝරත්න මහතා ii. දය$ තෙන්නකෝන් මහතා iii. ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු මහතා iv. ටෙනිසන් කුරේ මහතා } එක් අයෙකුට රු. 100,000.00 බැගින් ගෙවීම් කර ඇත.	**250,000.00** **400,000.00**	**650,000.00**
04.	**<u>චිත්‍රපට ආනයනය</u>** 2020 වර්ෂය සඳහා චිත්‍රපට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් අයදුම්පත් නිකුත් කිරීම. **(එක් අයදුම්පතක් වෙනුවෙන් රු. 25,000.00 බැගින්)** ඒ අනුව, 2020 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව - 19 කි. මෙම වර්ෂය තුල ආනයනය කරන ලද දමිළ/ඉංග්‍රිසි/හින්දි සහ වෙනත් භාෂාමය චිත්‍රපට සංඛ්‍යාව 78 කි. **(එක් චිත්‍රපටයක් වෙනුවෙන් රු. 5000.00 බැගින්)**		**475,000.00** **390,000.00**
05.	**<u>විදේශ රූගත කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.</u>** • කෙටි චිත්‍රපට - 1 සඳහා විදේශ සාමාජිකයින් 04 දෙනෙකු **(එක් අයෙකු සඳහා රු. 2000.00 බැගින් - 2020/03/01 දිනෙන් පසු)** • වාර්තා වැඩසටහන් - 12 - රු. 50,000.00 බැගින් වැඩසටහන් 08 - රු. 25,000.00 බැගින් වැඩසටහන් 04 - විදේශ සාමාජිකයින් 31 දෙනෙකු සඳහා **(එක් අයෙකු සඳහා රු. 5000.00 බැගින් -2020/03/01 දිනට පෙර)** - විදේශ සාමාජිකයින් 1 දෙනෙකු සඳහා **(එක් අයෙකු සඳහා රු. 2000.00 බැගින් - 2020/03/01 දිනට පසු)** - The Word Heritage • විදේශ චිත්‍රපට - 01 **(චිත්‍රපට 01 ක් රු. 150,000.00 බැගින්)** - විදේශ සාමාජිකයින් 64 දෙනෙකු සඳහා **(එක් අයෙකු සඳහා රු. 2,000.00 බැගින් - 2020/03/01 දිනට පසු)** • Photo Shoot - 04 **(50,000.00 x 03 සඳහා 2020/03/01 දින පෙර)** **(25,000.00 x 01 සඳහා 2020/03/02 දිනට පසු)** - විදේශ සාමාජිකයින් 8 දෙනෙකු සඳහා **(එක් අයෙකු සඳහා රු. 5,000.00 බැගින් - 2020/03/01 දිනට පෙර)** - විදේශ සාමාජිකයින් 2 දෙනෙකු සඳහා **(එක් අයෙකු සඳහා රු. 2,000.00 බැගින් - 2020/03/01 දිනට පසු)**	**75,000.00** **8,000.00** **400,000.00** **100,000.00** **155,000.00** **2,000.00** **11,000.00** **150,000.00** **128,000.00** **150,000.00** **25,000.00** **40,000.00** **4,000.00**	**83,000.00** **668,000.00** **278,000.00** **219,000.00**

06.වෙනත් (විශේෂ සේවා)

I. සිනමා ශිල්පීන් සඳහා සහ පැරණි චිත්‍රපට සඳහා අනන්‍යතාවය සහතික කිරීමේ ලිපි නිකුත් කිරීම.

II. සිනමා ශිල්පීන් සඳහා හැඳුනුම්පත් ලබා දීමට කටයුතු කිරීම.

III. ශ්‍රී ලංකා රේගුව වෙත රේගු නිෂ්කාශන ලිපි නිකුත් කිරීම.

IV. දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුව වෙත සිනමාශාලා වෙනුවෙන් බදු සහන ලබාදීම සඳහා තහවුරු ලිපි නිකුත් කිරීම.

V. මෙරට රුගත කරනු ලබන දේශීය හා විදේශිය චිත්‍රපට සහ අනෙකුත් වැඩසටහන් සඳහා විදේශයන් වෙතින් ආනයනය කරනු ලබන කැමරා ඇතුළු තාක්ෂණික මෙවලම් සඳහා ශ්‍රී ලංකා රේගුව වෙත ඇපකරයන් ලබාගැනීමෙන් අනතුරුව රේගු නිෂ්කාශන ලිපි නිකුත් කිරීම.

VI. සිනමාශිල්පීන්ගේ සුභ සාධන කටයුතු සඳහා සහන ලබා දීම.

VII. සිනමාව අධ්‍යනය කරනු ලබන විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන් වෙත සිනමාවට අදාල තොරතුරු ලබා දීම හා දේශන පැවැත්වීම.

VIII. මාධ්‍යවේදීන් සඳහා චිත්‍රපට නැරඹීමේ අවසරපත් ලබා දීම.

04. පිරිස් හා ආයතන පාලනය

2020.01.01 දිනට කාර්ය මණ්ඩලය	
අනුමත සංඛ්‍යාව	186
ස්ථීර සංඛ්‍යාව	136
2020 වර්ෂය තුළ ඉවත් වූ සංඛ්‍යාව	
විශ්‍රාම ලැබූ සේවක සංඛ්‍යාව	04
සේවයෙන් ඉල්ලා අස්වූ සේවක සංඛ්‍යාව	03
2020.12.31 ස්ථීර කාර්ය මණ්ඩලය	129
අනෙකුත් කාර්ය මණ්ඩලය	
සභාපති	01
2020.12.31 මුළු කාර්ය මණ්ඩලය	130

ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටුකිරීම

ආයතනයේ සේවක පාලනයට අදාලව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයමින් සේවා කටයුතු ඉටුකර ඇත.

05. චිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩ්

	විස්තරය	ප්‍රගතිය (රු. ශත)
01	**ලංකා ෆිල්ම්ස් ප්‍රදර්ශණ මණ්ඩලයේ හා රිත්මා මණ්ඩලයේ ප්‍රදර්ශණයට මුදා හරින ලද චිත්‍රපටවල පුවත්පත් ප්‍රචාරක කටයුතු.** • සුපර්ණා • සේද මාවත • ෂෙලීනා • පාංශු • මිස් ජෙනිස්	**259,000.00**
02	**ප්‍රධාන මාර්ගය ඉදිරිපිට සංස්ථා භූමියේ සවිකර ඇති යකඩ රාමු තුල චිත්‍රපට 12ක් 10 x 10 හා 10 x 20 ප්‍රමාණයේ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශණයට කටයුතු කිරීම.**	**232,125.00**

06. අභ්‍යන්තර විගණන කටයුතු

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ දර්ශනය සහ මෙහෙවර හා බැඳි අරමුණු ඉටු කිරීමේදී අපේක්ෂිත සහ සත්‍ය ප්‍රතිපල අතර පරතරය අවම කර ගැනීම සඳහා අවශ්‍ය සහාය දැක්වීම වෙනුවෙන් මූල්‍ය, පරිපාලන හා සංවර්ධන ව්‍යුහයන්වල නොගැලපීම් අතර පරතරය අවම කිරීම වෙනුවෙන් මෙම අංශයෙන් කටයුතු කෙරේ.

වසර තුළ පැවති විගණන හා කළමනාකරණ රැස්වීම් සංඛ්‍යාව - 02 කි.

පවත්වන ලද දිනයන් - 2020/02/10
2020/06/17

විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය

නම	තනතුර
ඩී.සී ජයදේව මහත්මිය	කමිටු සභාපති (භාණ්ඩාගාර නියෝජිත)
නාලක කළුවැව මහතා	කමිටු සාමාජික
ආචාර්ය රවීන්ද්‍ර රන්දෙණිය	කමිටු සාමාජික
ධම්මික් ෆොන්සේකා මහතා	කමිටු සාමාජික
ඩබ්. ශ්‍රියානි හංවැල්ල මහත්මිය	අභ්‍යන්තර විගණක (කමිටු කැඳවුම්කරු)

07. අධ්‍යාපන ප්‍රවර්ධන හා සංස්කෘතික

“ජීවිතයට සිනමාව” සිනමා රසවින්දන වැඩසටහන

වැඩසටහන	දිස්ත්‍රික්කය	දිනය	ස්ථානය	භෞතික ප්‍රගතිය (ප්‍රේක්ෂකත්වය)
සිනමා රසවින්දන වැඩමුලු	මොණරාගල	2020-01-17	තරුණ සේවා සභාව	අභ්‍යාසලාභීන් 250
			කාර්මික විද්‍යාලය	අභ්‍යාසලාභීන් 300
	කුරුණෑගල	2020-02-11	සාරිපුත්ත විද්‍යාපීඨය-දඹදෙණිය	අභ්‍යාසලාභීන් 400
		2020-02-12	වයඹ විද්‍යාපීඨය-බිංගිරිය	අභ්‍යාසලාභීන් 600
	කොළඹ	2020-02-28	මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසැල	සිසුන් 400
	මාතලේ	2020-03-04	මොරගහකන්ද සම්මන්ත්‍රණ ශාලාව	සිසුන් 2000
	කොළඹ	2020-08-27	නාලන්ද විද්‍යාලය	සිසුන් 800






සිනමා සංස්කෘතියේ පෝෂණය උදෙසා සිනමා කතිකා වැඩසටහන් සිදුකිරීම

මාතෘකාව	දිනය	ස්ථානය	භෞතික ප්‍රගතිය (ප්‍රේක්ෂකත්වය)
සිනමාවේ සෞන්දර්ය	2020-01-30	තරංගනී සිනමා ශාලාව	සහභාගීත්වය 200
සිනමා අධ්‍යාපනය හා ප්‍රේක්ෂකත්වය	2020-02-27		සහභාගීත්වය 250





සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2020


- 2018 වර්ෂයේ පාඨමාලාව සාර්ථකව නිමකල විද්‍යාර්ථීන් 20 දෙනෙකු සඳහා සහතික ප්‍රධානෝත්සවය 2020.07.30 දින පවත්වන ලදි
- 2019 වර්ෂයේ පාඨමාලාවේ දෙවන අදියර අධ්‍යයන කටයුතු අවසන් කරන ලදි.



සිනමා ප්‍රකාශන නිකුත් කිරීම

වැඩසටහන	සමාජීය ප්‍රතිලාභය	භෞතික ප්‍රගතිය
චිත්‍රපට සඟරාව 2020 පළමු කලාපය	සිනමා සාක්ෂරතාව පෝෂණය	පිටපත් ප්‍රමාණය 1000
චිත්‍රපට වාර්ෂිකය		පිටපත් ප්‍රමාණය 1000





08. චිත්‍රපට බෙදාහැරීම්

චිත්‍රපට ප්‍රදර්ශනය

- 2020 වර්ෂය තුළ දී රිත්මා මණ්ඩලයේ සිනමා ශාලා 65ක් ක්‍රියාත්මක විය.

චිත්‍රපට මුදාහැරීම

- සිනමාශාලා 65ක් සඳහා රිත්මා මණ්ඩලය මගින් චිත්‍රපට මුදාහැර ඇත.
- 2020 වර්ෂය තුළ රිත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සමග ඒකාබද්ධ වී චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.
- රිත්මා මණ්ඩලය මගින් සිංහල චිත්‍රපට 03ක් මුදාහැරීමට කටයුතු කර ඇත.
- මෙම වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයන කරන ලද දමිළ චිත්‍රපට 05ක් හා හින්දි චිත්‍රපට 04ක් හා ඉංග්‍රීසි චිත්‍රපට 03ක් රිත්මා මණ්ඩලයේ හා අනෙකුත් මණ්ඩල සිනමාශාලාවන් හා ඒකාබද්ධ වී රිත්මා මණ්ඩලය මගින් මුදාහැරීමට කටයුතු කර ඇත. (සංස්ථා මණ්ඩලය වෙත ලබා දී ඇති කොටසින් (කෝටා) චිත්‍රපට ලබාගෙන රිත්මා මණ්ඩලය විසින් මුදාහැරීමට කටයුතු කර ඇත.)
- 2020 වර්ෂයේ කොවිඩ් 19 වසංගතයේ පළමු හා දෙවන රැල්ල නිසා සෞඛ්‍ය හේතූන් මත සිනමාශාලා මාස කිහිපයක් වසාදමන ලදි.

09. දේශීය සැපයුම් ආනයනය හා අපනයනය

- සිනමාශාලා හිමියන් සහ සංස්ථාවේ අවශ්‍යතාවයන් පරිදි කාර්මික උපකරණ හා කාර්යාලීය ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ නියමිත ක්‍රමවේදයන්ට අනුව මිල ගෙන සැපයීම.
- සරසවි චිත්‍රාගාරය සඳහා 7.1 ශබ්ද ප්‍රතිවාදන පද්ධතිය ස්ථාපනය කිරීම, CP 950 ප්‍රොසෙසරය මිලදී ගැනීම සහ සංස්කරණ පද්ධතිය ස්ථාපනය කිරීම.
- සරසවි චිත්‍රාගාරයේ කලු සුදු වර්ණ රසායනාගාරයේ විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම.
- අදාළ නියෝජිත ආයතන සමඟ භාණ්ඩ හා සේවාවන්ට අදාළ සේවා ගිවිසුම් යාවත්කාලීනව පවත්වාගෙන යාම.

10. මූල්‍ය කටයුතු

01. ආදායම් ප්‍රභවයන්

2019 - 2020 යන වර්ෂයන්හි සත්‍ය ආදායම හා 2020 වර්ෂයේ අයවැය ගත ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම	2019 සත්‍ය රු.මි.	2020 සත්‍ය රු.මි.	අඩු/වැඩි වීම	2020 අයවැය රු.මි.
බෙදාහැරීමේ කොමිස් දේශීය -	12.6	4.1	(67.5)	35
විදේශීය	20.6	7.3	(64.6)	
වැඩිවීම (සංස්ථාභාරය)	7.9	1.3	(83.5)	8
අධිභාර පරීකෂණ දඩ මුදල් හා වෙනත්	5.7	2.5	(56.1)	6.1
සිනේඇඩිස් කොමිස්	0.5	0.3	(40.0)	0.7
චිත්‍රාගාරයේ ආදායම	1.7	1.3	(23.5)	0.5
වෙළඳ කටයුතු	1.7	0.8	(52.9)	1.9
මෙහෙයුම් ආදායම්	**50.7**	**17.6**	(65.2)	**52.7**
වෙනත් ආදායම්	**68.6**	**49.7**	(27.6)	**65.4**
භාණ්ඩාගාරයෙන් ජනාධිපති සම්මාන උළෙල සඳහා-	**25**	**0**	(100.0)	**0**
පුනරාවර්තන වියදම් සඳහා ලැබීම්	**80.8**	**90**	11.4	**125**
මුළු ලැබීම්	**225.1**	**157.3**	(30.1)	**243.1**

2019 ට සාපේක්ෂව සලකා බැලීමේදී මෙහෙයුම් ආදායම 2020 දී 2019 ට වඩා 65.2% ක අඩුවීමක් පෙන්වා ඇත .දේශීය බෙදාහැරීමේ කොමිස් 67.5% කින් ද ,විදේශීය බෙදාහැරීමේ කොමිස් 64.6% ද අඩු වීම මෙහෙයුම් ආදායම අඩු වීමට ප්‍රධාන හේතුව වේ. 2020 වර්ෂයේ මාර්තු මස සිට මේ දක්වා පවතින කොවිඩ් -19 වසංගත තත්වය හේතුවෙන් වැඩිකාලයක් සිනමාශාලා වසා දැමීමට සිදුවූ අතර විවෘත කර තිබූ සීමිත කාලය ඇතුලත ප්‍රේක්ෂක පැමිණීම අවම මට්ටමින් පැවතුණි.

02. <u>වියදම් ප්‍රභවය</u>

2019, 2020 යන වර්ෂයන්හි සත්‍ය වියදම සහ 2020 වර්ෂයේ අයවැයගත වියදම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වියදම	2019 සත්‍ය රු.මි.	2020 සත්‍ය රු.මි.	අඩු/වැඩි වීම	2020 අයවැය රු.මි.
සේවක පාරිශ්‍රමික	90	91.7	1.9	123.2
ගමන් හා යැපීම් දීමනා	1.4	0.5	(64.3)	4
සැපයුම් හා උපකරණ	9.1	5.1	(44.0)	10.7
අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම්	30.5	22.8	(25.2)	38.4
ජාතික චිත්‍රපට උත්සව	26.2	0	(100.0)	2
විකුණුම් පිරිවැය	4.4	0.06	(98.6)	2.1
ප්‍රවාහන සම්බන්ධතා,අවශ්‍යතා වෙනත්	28.2	22.9	(18.8)	60.8
බොල් ණය වෙන් කිරීම්	0.2	0.1	(50.0)	5
පාරිතෝෂික වෙන් කිරීම	3.5	12.5	257.1	7.9
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල	0.5	0.5	-	10.5
මුළු වියදම	194	156.2	(19.5)	264.6

2019 වර්ෂයට සාපේක්ෂව 2020වර්ෂයේ දී වියදම 19.3% කින් අඩු වී ඇත. එයට ප්‍රධානම හේතුව කොවිඩ් -19 වසංගතය හේතුවෙන් සංස්ථාවේ ඉලක්ක වෙත යාමට නොහැකිවීම සහ සේවා ස්ථානය මාස කිහිපයක් වසා තබා තිබීම හේතුවෙන් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 දී වියදම අඩුවී ඇත.

	2019 රු.මි.	2020 රු.මි.	%
මෙහෙයුම් ආදායම	50.7	17.6	(65.2)
අඩුකළා			
මෙහෙයුම් වියදම	194	156.2	(19.5)
මෙහෙයුම් ලාභය / අලාභය	(143.3)	(138.6)	(3.3)
එකතුකළා			
වෙනත් ආදායම්	68.6	49.7	(27.6)
වර්ෂයේ ලාභය / අලාභය	(74.7)	(88.9)	(19.2)
එකතුකළා භාණ්ඩාගාරයෙන් - ජනාධිපති සම්මාන උළෙල සඳහා පුනරාවර්ථන වියදම් සඳහා ලැබීම	105.8	90	(14.9)
අතිරික්තය	30.9	1.1	(96.4)

2019ට සාපේක්ෂව 2020 වර්ෂයේදී මෙහෙයුම් අලාභය 3.3% කින් අඩු වෙනත් ආදායමද 27.6% කින් අඩු වුවද 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ අලාභය 19.2% කින් වැඩි වී ඇත . පුනරාවර්තන ලැබීම් ගැලපීමෙන් පසු 2019 වර්ෂයට වඩා 2020 වර්ෂයේ 96.4% කින් අතිරික්තය අඩුවී ඇත .මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ 2019 වර්ෂයට සාපේක්ෂව 2020 දීවියදම අඩුවුවත් 2020 වර්ෂයේ ආදායම අඩුවීම මත අතිරික්තය අඩු වී ඇත.

01. ස්ථාවර වත්කම්

2020 වර්ෂයේදී කාර්යාල උපකරණ හා වායු සමීකරණ මිලදී ගැනීම සඳහා මිලියන 1.7 ක් ද, දේශනශාලාව සඳහා ප්‍රක්ෂේපන යන්ත්‍රයක් මිලදී ගැනීමට රු.මි.0.2 සහ චිත්‍රාගාරයට යාන්ත්‍රික උපකරණ මිලදී ගැනීම සඳහා රු.මි.01ක් ද, වැය කර ඇත.තවද, ලෙස්ටර් ජේම්ස් පීරිස් කෞතුකාගාර ගොඩනැගිල්ල සඳහා මිලියන 4.7, බී. ඒ. ඩබ්ලිව්. ජයමාන්න මැදිරිය සඳහා රු.මිලියන 9ක් සහ නව ගොඩනැගිල්ලේ වායු සමීකරණය කිරීම සඳහා රු.මි.5.7 ක් නොනිමි කාර්යයන් සේ දක්වා ඇත.

04. ජංගම වත්කම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සලකා බලනවිට ජංගම වත්කම් රු.මි.2.3 කින්වැඩි වී ඇත. එසේ වුවද ණයගැති ශේෂයෙන් අයකර ගත නොහැකි පැරණි ණය, බොල්ණය වශයෙන් අඩුකර පෙන්වීම සහ වර්තමාන ණයගැති ශේෂය අයවීම මත සමස්ථ ණයගැති ශේෂ රු.මිලියන 06කින් අඩු වී ඇත.

2020 වර්ෂයේදී ආයෝජන කල්පිරීමෙන් පසුවලැබුණු පොලි මුදල නැවත අයෝජනය කිරීම නිසා වර්ෂයේ ආයෝජනය රු.මිලියන 11 කින් වැඩිවි ඇත.

05. ජංගම වගකීම්

චිත්‍රපට කුලි ණයහිමියන් පසුගිය වර්ෂය සමග සැසඳීමේදි රු.මි.1.7කින් අඩුවි ඇත.

11. නීති අංශය

2020 වර්ෂය තුල නීති අංශය මඟින් සිදු වී ඇති කාර්ය භාරය

- සංස්ථාව පාර්ශවයක් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනු කිරීම හා අදාල අධිකරණයේ සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.
- කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කාර්මික ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.
- මානව හිමිකම් කොමිසම් සභාවේ විභාග වන පැමිණිලි සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.
- දේශීය චිත්‍රපට නිෂ්පාදනය හා බෙදාහැරීම, ආනයනය කරනු ලබන චිත්‍රපට බෙදාහැරීම සම්බන්ධයෙන් සහ චිත්‍රපට නිෂ්පාදනය/ චිත්‍රාගාර සේවා/ පිටපත් මුද්‍රණය/ සිනමාශාලා සඳහා ණය මුදල් ලබා දීම සහ සේවා සැපයීම ඇතුළු සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.
- ජාතික චිත්‍රපට සංස්ථාවට උපකාරක සේවා ලබා ගැනීම සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් සියළුම නීත්‍යාණුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.
- එදිනෙදා අවශ්‍යතාවය පරිදි සංස්ථාවේ ඕනෑම අංශයකින් යොමු කරන නීතිමය ගැටළු සඳහා උපදෙස් ලබා දීම.

අධිකරණ කටයුතු

1. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක: HCCA/LA 329/2019 (2020-09-30 දක්වා)
2. අභියාචනාධිකරණ නඩු අංක : 239/2019 (2020-02-07 දක්වා)
3. අභියාචනාධිකරණ නඩු අංක : 308/2019, 309/2019, 329/2019
4. අභියාචනාධිකරණ නඩු අංක : 870/99 කලුතර ප්‍රිස්කා සිනමා ශාලාව
5. සිවිල් අභියාචනාධිකරණ නඩු අංක : 114/2019LA
6. මාතර දිසා අධිකරණය :Pro-318 නිව් සිනමාසිනමා ශාලාව,මාතර
7. කොළඹ දිසා අධිකරණය : DMR 2306/13 වලාපටළ චිත්‍රපටය
8. කොළඹ දිසා අධිකරණය : DSP 140/2015 (2020-06-29 දක්වා)
9. කොළඹ දිසා අධිකරණය : DMR 1126/12 සිනෙසිටි සිනමාශාලා 4 න් සංස්ථාවට අයවිය යුතු සංස්ථා භාරය නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් නඩු පවරන ලදී.
10. කොළඹ දිසා අධිකරණය : DSP 00166/17 කාලචිත්‍රපටය
11. වාණිජ මහාධිකරණය : 23/2019 සංගිලි චිත්‍රපටය (2020-07-03 දක්වා)
12. මහේස්ත්‍රාත්අධිකරණය : B-27340/05/20 (කම්කරු නඩු අංකය: CO 8/29/18) සංස්ථා සේවකසමිත දිසානායක මයා ඇතුළු සේවකයින් 111 දෙනෙකු

කම්කරු දෙපාර්තමේන්තුවේ පැවති හා පවතින පරීක්ෂණ

1. කාර්මික අධිකරණය: A/11/2019 ඩී.ආර්.එස්.පෙරේරා මිය
2. කාර්මික අධිකරණය: A/70/2020 එම්.ඒ.ඩබ්.කුමාරසිරි ඇතුළු සේවක පිරිස
3. මැද කොළඹ දිස්ත්‍රික්කම්කරු කාර්යාලය :CC/C/EPF/2/513/2020ඩබ්.එස්.ෆොන්සේකා මහතා
4. මැද කොළඹ දිස්ත්‍රික්කම්කරු කාර්යාලය :CC/C/EPF/2/323/2020 ආර්.පී.ජේ.රාජපක්ෂ (2020-09-10 දක්වා)
5. කම්කරු විනිශ්චයසභා නඩු අංක : 13/41/2013

මානව හිමිකම් කොමිසම් සභාවේ පවතින පරීක්ෂණ

1. HRC/566/20 - වික්ටර් මානගේ මහතා
2. HRC/1334/20 -ඩබ් කේ. වික්‍රමාආරච්චි මිය
3. HRC/2804/19 - කීර්ති බණ්ඩාර මහතා
4. HRC/2571/19 - ජේ.මාරසිංහ මහතා
5. HRC/695/20 - පී.වික්‍රමසූරිය ඇතුළු පිරිස
6. HRC/614/20 - බී.ජී.කේ.සී. පෙරේරා මිය
7. HRC/2754/19 - පී.එච්.සී.යූ. බණ්ඩාර මහතා
8. HRC/704/20 - වෛද්‍ය දිලූෂා ද සිල්වා මිය
9. HRC/172/20 - දිනේෂ් ප්‍රියසාද් මහතා

12. චිත්‍රාගාර සේවාවන් සැපයීම

ශබ්ද අංශ ශබ්ද මිශ්‍රණ කටයුතු , දෙබස් පටිගත කිරීම් සහ Track Laying.

	චිත්‍රපටය /වැඩසටහන
1.	ආයු
2.	රජ දහන
3.	ඇගේ නම රති
4.	Bullet Proof Children
5.	KadiraDivyaRja
6.	Flying Fish
7.	මොණරවිල
8.	ටිකිරි මාරි - වෙළඳ දැන්වීම්
9.	පදනම් ආයතනය - ප්‍රායෝගික පාඩම් මාලාව
10.	My Father is a Dog - කෙටි චිත්‍රපට
11.	සුනාමි
12.	Buffalo Travelers

- වාර්ෂික ආදායම ශබ්ද අංශය – **රු. 832,772.00**

රුගත කිරීමේ මැදිරිය සහ චිත්‍රාගාර පරිශ්‍රය

	චිත්‍රපට/ ආයතනය
01.	Derana – Little Star
02.	Derana – 60 Plus
02.	Wing Music–Music Program
04.	X 10 – Singer – TV Commercial Singer
05.	The Game - Film
06.	X 10 – Pears Baby – TV Commercial
07.	Derana– MaNowana Mama
08.	X 10 – Lux– TV Commercial
09.	Daddy Music – Musical program

වාර්ෂික ආදායම රුගත කිරීමේ මැදිරිය සහ චිත්‍රාගාර පරිශ්‍රය – **රු3,577,856.82**

සංස්කරණ අංශය

2018 මැයි මස සිට සංස්කරණ පද්ධතිය අක්‍රීයව පවතී. 2021ජනවාරි 21 දින සිට යාවත්කාලීන කර සංස්කරණ අංශයේ කටයුතු නැවත ආරම්භ කරන ලදී.

සංරක්ෂණාගාර

- ❖ පැරණි චිත්‍රපට 250 පමණ සංරක්ෂණය කිරීම සඳහා තෝරා ගන්නා ලදී.
- ❖ පැරණි එතුම් 150ක් පමණ ප්‍රමාණයක් රසායනික ද්‍රව්‍ය යොදා පවිත්‍ර කොට අලුත් ප්ලාස්ටික් බහාලුම් වලට දමා වායුසමීකරණ කාමරය තුල තැම්පත් කිරීම

අනෙකුත් කාර්යයන්

- ➢ 2020.06.12 වන දින සංස්ථා සභාපතිතුමා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩල සමාජික මහත්ම මහත්මීන් චිත්‍රාගාර කාර්යය මණ්ඩලය සමග චිත්‍රාගාරයේදි පැවැති රැස්වීමේ දී චිත්‍රාගාරයේ ඉදිරි සංවර්ධන යෝජනා රැසක් පිළිබඳ සකච්ජා විය. එහි දි චිත්‍රාගාර භූමියේ පසු තල දර්ශන නිර්මාණය හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් උද්‍යාන නිර්මාණ සැලසුම් පිළිබඳ අවශ්‍ය මිනුම් සහ තොරතුre ලබාගන්නා ලදී.
- ➢ ශබ්ද අංශයේ දෙබස් හා Folly Sound පටිගත කිරීමේ මැදිරිය වසර අවසන් වන විට අවසන් අදියරයට පැමිණ තිබුණි.
- ➢ ශබ්ද අංශයේ 5.1 ශබ්ද මැදිරිය චිත්‍රාගාර කාර්යය මණ්ඩලයේ ශ්‍රම දායකත්වයෙන් 2020 වසර මැද භාගයේ දී 5.1 තාක්ෂණයෙන් යුතු ශබ්ද මිශ්‍රණ සහ දෙබස් පටිගත කිරීමේ මැදිරිය ස්ථාපිත කිරීම.
- ➢ 2020 වර්ශයේ අග භාගයේදි ශබ්ද අංශයේ 5.1 තාක්ෂණය තවදුරටත් වැඩි දියුණු කර 7.1 ශබ්ද මැදිරිය විවෘත කරන ලදී.
- ➢ චිත්‍රාගාරයේ වේශ නිරූපන මැදිරියේ නවීකරණ සැලැස්ම සහ ඇස්තමේන්තුව රාජ්‍ය ඉන්ජිනේරුසංස්ථා මගින් සිදුකරන ලදී.
- ➢ 2020 මාර්තු මස සිට රට පුරා ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය හේතුවෙන් චිත්‍රාගාරයේ සේවාවන් ලැබීමට වෙන් කර තිබූ වැඩසටහන් ගණනාවක් අවලංගු කිරීමට සිදු විය.

13. විමර්ශන කටයුතු

2020 වර්ෂය තුළ විමර්ශන අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්

1. සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස්කිරීම.
2. නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.
3. සිනමාශාලා පරීක්ෂා කිරීම හා අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.
4. විදේශ රූගත කිරීම් අධීක්ෂණය.

01. සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස්කිරීම.
2020 වර්ෂය තුල සිනමාශාලා ඉදිකිරීම සම්බන්ධ තොරතුරු රැස්කිරීම.

- ❖ වැලිගපොල
- ❖ මිනුවන්ගොඩ
- ❖ බණ්ඩාරගම

02. 2020 වසර තුල ඉදිකරන ලද නව සිනමාශාලා
1. K.C.C සිනමා සංකීර්ණය - සිනමාශාලා 03
2. K.M.C සිනමා සංකීර්ණය - සිනමාශාලා 04
3. අමුතා සිනමා - වවිනියාව
4. සිටි සිනමා - කොච්චිකඩේ

03. සිනමාශාලා පරීක්ෂා කිරීම

- ❖ පරීක්ෂණ අංශයේ ප්‍රධාන රාජකාරිය වන්නේ සිනමාශාලා පරීක්ෂා කිරීමයි. 2020 වර්ෂයේ පරීක්ෂන වාර 1107 සිදුකර ඇත.

- ❖ සිනමාශාලා වල සිදුවන අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.

  පරීක්ෂන නිලධාරීන් විසින් සිනමාශාලා පරීක්ෂා කිරීමේදි විවිධ අක්‍රමිකතා හඳුනාගෙන ඇත. 2020 වර්ෂය සඳහා රු. 271,470.00 වටිනාකමකින් යුතු හරපත්‍ර 50 ක් නිකුත් කර ඇත.

04. විදේශ රූගත කිරීම් අධීක්ෂනය

මෙම අංශයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින් විසින් සිදුකරනු ලබන වෙළඳ දැන්වීම්, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් රූගත කිරීම් අධීක්ෂණය කෙරේ. ඒ අනුව

- ❖ වසර තුළ විදේශ රූගත කිරීම් 15 ක් අධීක්ෂණය කර ඇත.

05. 2020 වර්ෂය සඳහා සිනමාශාලා 32 සඳහා මත්පැන් බලපත්‍ර නිකුත් කර ඇත.

06. වර්ෂය තුළ ප්‍රවේශපත්‍ර සංශෝධන 13 සිදුකර ඇත.

14. සැලසුම්, සංඛ්‍යාලේඛන හා පුහුණු

මෙම අංශයේ ප්‍රමුඛ කාර්යභාරය පහත පරිදි වේ.

- ආයතනික සැලසුම් සකස් කිරීමේ අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීම.
- සංයුක්ත සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා ප්‍රගතිය අධීක්ෂණය
- වාර්ෂික වාර්තා පිළියෙල කිරීම
- මාසික සහ කාර්තුමය ප්‍රගතිය රේඛීය අමාත්‍යාංශය සහ අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- කාර්යමණ්ඩල පුහුණු අවශ්‍යතාවන් හඳුනාගැනීම හා වාර්ෂික පුහුණු සැලසුම් සකස් කිරීම.
- සංස්ථාවට අයත් ගැසට් වක්‍රලේඛ හා වෙනත් සංඛ්‍යාත්මක දත්ත ආදිය එක්රැස්කර පරිගණක දත්ත පද්ධතියක් පවත්වා ගැනීම.

15. වෛද්‍ය සහනාධාර ක්‍රමය

සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රදානය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුල ද ක්‍රියාත්මක වූ අතර එහි පාලන කමිටුව පහත පරිදි වේ.

- ගයනි මුණවීර මහත්මිය - වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් (කමිටු සභාපති)
- අසංක ගුණතිලක මහතා - පරිපාලන නිලධාරි - පාලන හා මානව සම්පත් (රා.ආ)
- කේ. ආර්. වින්සන් මහතා - කමිටු සාමාජික
- සුබිත ඉලංගකෝන් මහතා - කමිටු සාමාජික

16. සුභසාධක සංගමය

සංස්ථා ණයදීමේ හා සකසුරුවම් කිරීමේ සමූපකාර සමිතිය මෙම වර්ෂයේදී ද ක්‍රියාත්මක විය.

17. බෞද්ධ සංගමය

සංස්ථා සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා අවශ්‍ය පොත් ලබා දීම වසර තුළ මූලිකව සිදුකර ඇත.

18. ක්‍රීඩා සංගමය

මේ වසර තුළ ද ක්‍රීඩා සංගමය ක්‍රියාත්මක අතර කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත ක්‍රියාකාරකම්වල නිරතවීමේ අඩුවක් දක්නට ලැබේ.

19. වෘත්තීය සමිති

ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, චිත්‍රපට සංස්ථා සේවක සංගමය හා වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමය මෙම වසර තුළදී ද පාලන අධිකාරිය සමග සහයෝගයෙන් කටයුතු කර ඇත.

20. ස්තූතිය


2020 වසරේ සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සංස්ථා කාර්යමණ්ඩලය ඉතා වගකීමෙන් හා ධෛර්යයෙන් යුතුව සිය සේවාවන් ඉටුකර ඇත.

එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තූතිය කෘතවේදීව පල කර සිටිමි.

අත්සන් කලේ - ජයන්ත ධර්මදාස
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

රවි ප්‍රසාද් කලුපහන
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව



මූල්‍ය ප්‍රකාශන

2020

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2020.12.31 දිනට අවසන් වර්ෂය සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

විස්තරය	සටහන		2020 රු.	2019 රු.
විකුණුම්	03		17,653,672	50,800,475
අඩු කළා : විකුණුම් පිරිවැය	04		(57,863)	(4,424,231)
දළ ලාභය			17,595,809	46,376,244
අඩු කළා : වියදම්				
සේවක පාරිශ්‍රමික	05		(91,742,352)	(89,929,560)
ගමන් හා යැපීම් දීමනා	06		(471,632)	(1,386,049)
සැපයුම් හා උපකරණ	07		(5,103,699)	(9,142,609)
අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම්	08		(22,835,028)	(30,475,643)
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා	09		(22,937,991)	(29,373,187)
බොල් ණය සඳහා හානිකරන ගැලපීම්	16-A		(113,490)	(210,041)
පාරිතෝෂික වෙන් කිරීම්	20		(12,457,075)	(3,486,140)
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා දායකත්වය			(500,000)	(500,000)
			(156,161,265)	(164,503,230)
මෙහෙයුම් ලාභය / අලාභය			(138,565,456)	(118,126,986)
එකතු කළා :				
වෙනත් ආදායම්	10	8,930,658		
ස්ථාවර හා භාණ්ඩාගාර බිල් පොළී		20,402,037		
භාණ්ඩාගාර ලැබීම් ආධායමට හදුනා ගැනීම්		11,492,198		
224 ගොඩනැගිලි කුලී		8,880,000		
			49,704,892	68,612,595
වසරේ ලාභය /අලාභය			(88,860,564)	(49,514,391)
එකතු කළා : භාණ්ඩාගාර ලැබීම්			90,000,000	80,750,000
බදු පෙර ලාභය			1,139,436	31,235,609
අඩු කළා : බදු සඳහා වෙන් කිරීම්				
ඌනතාවය / අතිරික්තය			1,139,436	31,235,609

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2020 රු.	2019 රු.
නියෝජනය වන්නේ			
ස්ථාවර වත්කම්			
දේපල , යන්ත්‍ර සුත්‍ර හා උපකරණ	11	335,219,247	330,003,870
දිගු කාලීන ආයෝජන	12	26,737,169	23,590,724
		361,956,417	353,594,595
ජංගම වත්කම්			
කෙටි කාලීන ආයෝජන	13	201,875,032	315,230,612
තොග	14	7,084,395	6,303,556
ණයගැතියෝ	15	111,409,083	117,087,522
විවිධ ණයගැතියෝ	16	188,916,063	189,353,380
තැන්පතු හා ඉදිරි ගෙවීම්	17	3,418,948	3,631,673
මුදල් හා බැංකු ශේෂය	18	144,745,749	23,541,601
		657,449,270	655,148,343
මුළු වත්කම්		1,019,405,686	1,008,742,937
යෙදවූ ප්‍රාග්ධනය			
අනුදත් ප්‍රාග්ධනය		10,000,000	10,000,000
සමුච්චිත ලාභය		424,483,286	415,669,539
වෙනත් සංචිත		134,282,759	134,282,759
		568,766,045	559,952,299
ජංගම නොවන වගකීම්			
ප්‍රදානයන්	19	90,667,934	87,160,132
පාරිතෝෂික වෙන් කිරීම්	20	51,335,633	42,365,554
		142,003,567	129,525,686
එකතු කළා : ජංගම වගකීම්			
තැන්පතු	21	2,949,499	3,256,525
චිත්‍රපට කුලී ණයහිමියෝ	22	233,842,034	251,146,803
වෙනත් ණයහිමියෝ	23	71,844,541	64,861,624
		308,636,074	319,264,953
මුළු වගකීම්		1,019,405,686	1,008,742,937

පිටු අංක 05 සිට 24 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 25 සිට 39 දක්වා ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසකි. මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් කර ඇත.

ජී.එන්.මුණසිංහ
වැ.බ.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-මුදල්

වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
නො.303, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

ආචාර්ය ජයන්ත ධර්මදාස
සභාපති

ජයන්ත ධර්මදාස
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
303, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

අධ්‍යක්ෂ

එස්. ටී. කොඩිකාර
ලේකම්
ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශය
14 වන මහල - සුහුරුපාය.
බත්තරමුල්ල

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
303 , බෞද්ධාලෝක මාවත
කොළඹ 07.
2021.07.30

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	හිමිකම් ප්‍රාග්ධනය රු.	සමුච්චිත ලාභය රු.	ප්‍රාග්ධන සංචිත රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	වෙනත් සංචිත රු.	එකතුව රු.
2019.01.01 දිනට ශේෂය	10,000,000	384,433,931	499,898	125,953,399	7,829,462	528,716,690
වසරේ ලාභය	-	31,235,610	-	-	-	31,235,610
පසුගිය වසරට ගැලපීම් (සටහන 2.15)		7,674,309				7,674,309
2019.12.31 දිනට ශේෂය	10,000,000	423,343,850	499,898	125,953,399	7,829,462	567,626,609
						-
වසරේ ලාභය	-	1,139,436	-	-	-	1,139,436
2020.12.31 දිනට ශේෂය	**10,000,000**	**424,483,286**	**499,898**	**125,953,399**	**7,829,462**	**568,766,045**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020	2019
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්	රු.	රු.
බදු අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය	(88,860,564)	(49,514,391)
(අඩු කළා)		
නිෂ්පාදන ණය මත පොළිය	-	(5,761)
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	(20,402,037)	(27,615,541)
	(109,262,601)	(77,135,693)
මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයයන් සඳහා ගැලපීම		
ක්ෂයවීම්	17,179,605	22,293,932
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	12,457,075	3,983,291
රාජ්‍ය ප්‍රදානයන් ආදායමට හඳුනා ගැනීම	(11,492,198)	(17,021,778)
භාණ්ඩාගාර ලැබීම්-ජනාධිපති සම්මාන උළෙල	-	(20,000,000)
	(91,118,119)	(87,880,247)
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන්		
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම	3,603,107	
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම	7,674,309	5,268,690
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	(79,840,703)	(82,611,557)
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම්		
තොගය (වැඩිවීම)	(780,839)	(253,225)
ණයගැතියෝ (අඩුවීම)	5,678,439	11,669,524
තැන්පතු හා ඉදිරි ගෙවීම් (අඩුවීම)	650,041	245,761
තැන්පතු වගකීම (අඩුවීම)	(307,027)	287,027
ණයහිමියෝ (අඩුවීම)	(17,304,769)	(1,951,663)
වෙනත් ණයහිමියෝ (අඩුවීම)	6,982,916	(23,432,778)
	(84,921,941)	(96,046,911)
අඩු කළා :		
පාරිතෝෂික ගෙවීම්	(3,486,995)	(4,768,794)
	(88,408,936)	(100,815,704)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
නිෂ්පාදන ණය පොළී	-	5,761
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	20,402,037	27,615,541
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	(25,998,090)	(18,549,939)
භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජනය	110,209,135	(21,412,105)
භාණ්ඩාගාර ලැබීම්	105,000,000	100,750,000
මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම් (අඩුවීම)	121,204,147	(12,406,446)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	23,541,601	35,948,047
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	144,745,749	23,541,601

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ කළමනාකරණය,

1. සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු මූල්‍ය ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීම පිළිබඳව,

2. සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා, 1995 අංක.15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම පිළිබඳව හා

3. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ විෂමතා වැලැක්වීම සඳහා උචිත පියවර ගැනීම පිළිබඳව වගකිව යුතු වන්නේය.

1. පොදු තොරතුරු

1.1.1 පිහිටීම හා නීතිමය තත්ත්වය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 1971 අංක.47 දරන පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කොට පිහිටුවන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය , කොළඹ 07 , බෞද්ධාලෝක මාවතේ අංක.303 දරන ස්ථානයෙහි පිහිටියේය.

1.1.2මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වරූපය

ශ්‍රී ලාංකේය සිනමාවේ දේශීය අනන්‍යතාව ජාත්‍යන්තරයේ සනිටුහන් කල හැකි ගුණාත්මක සිනමා සංස්කෘතියක් ඇති කිරීමේ පුරෝගාමියා බවට පත්ව සිටී.

1.1.3 නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය

මෙම මූල්‍ය ප්‍රකාශනයන් බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.07.30 දින අනුමැතිය දෙන ලදී.

1.2ගිණුම් පිළියෙල කිරීමේ පදනම

1.2.1අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහිත සටහන් (මූල්‍ය ප්‍රකාශන) සකස් කරන ලද්දේ, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මඟින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිද්දෙනි.

1.2.2මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ කළමනාකරිත්වය විසින් දරනු ලැබේ.

1.2.3ගිණුම්කරණ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් උචිත හෙළිදරව් කිරීමක් කර ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කොට සකස් කර ඇත.

1.2.4අඛණ්ඩතාව

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකරණය විසින් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. සංස්ථාව , එහි මෙහෙයුම් පෙනෙන අනාගත කාලය තුළදී පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් තිබෙන බව විශ්වාසනීයව අපේක්ෂා කරයි. තිබෙන්නා වූ සියලු තොරතුරු සැලකිල්ලට ගත් විට ඉදිරියේදී සංස්ථාව ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට හේතුවක් නොපෙනෙන අතර , අඛණ්ඩව පවත්නා ආයතනයක් සේ සලකා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.2.5ක්‍රියාත්මක වීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සංස්ථාවේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.2.6 වැදගත් වන ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපලේඛන

වාර්තා කරන දිනයේදී වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම පිළිබඳව වාර්තා කරන ලද සංඛ්‍යාවන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට අවශ්‍ය වේ. කෙසේ වුවද, මෙම උපකල්පනයන්ගේ හා ඇස්තමේන්තු වල තිබෙන්නා වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් අනාගතයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම් වල සැලකිය යුතු ගැලපීම් කිරීමට අවශ්‍ය වන්නා වූ බලපෑම් ඇතිවිය හැකිය. මෙම කාරණයන්හි විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් ඇතුළත් විය හැකිය.

ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම්හි සැලකිය යුතු ගැලපීම් කිරීමට සිදු වන්නා වූ, විශේෂිත අවදානම් ඇතිවිය හැකි, වාර්තා කරන දිනට පැවති අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් හා ඇස්තමේන්තු මූලාශ්‍රයන් පහත දක්වා ඇත.

(අ) මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය

ශේෂ පත්‍රයෙහි වාර්තා කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳ පොලේ ව්‍යුත්පන්න විය නොහැකි අතර, ඒවා වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහනයන් සහ / හෝ ගණිතමය ආකෘති ඇතුළු ශිල්ප ක්‍රම භාවිතා කරමින් නිශ්චය කර ඇත. මෙම ආකෘති වල යෙදවුම්, හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්තයන්ද එවැනි දෑ නොමැති විට විනිශ්චය කිරීමෙන්ම ලබා ගන්නා ලදී.

මෙම සාධකයන් පිළිබඳ උපකල්පනයන්හි වෙනස්වීම් වාර්තා කර ඇති මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය කෙරෙහි බලපෑ හැකිය.

(ආ) සාධාරණ අගය

සාධාරණ අගය යනු දැනුමක් හා කැමැත්තක් ඇති පාර්ශව අතර අතේ දූරින් සිදු වූ ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගයයි. මූල්‍ය සාධන පත්‍රයක් මුලින්ම හඳුනා ගැනීමේදී එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් ගැනෙන්නේ ලැබූ හෝ ගෙවූ වටිනාකමයි. පසුකාලීනව මූල්‍ය වත්කමක සාධාරණ අගය වන්නේ සක්‍රීය වෙළඳපොලක ඉල්ලුම් කෙරෙන ලංසු තබන මිළයි. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන මිළයි. මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන සඳහා පවත්නා අගය වන්නේ සාධාරණ මිළයි.

2.විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම-

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී හෝ වර්ෂයක් තුළ හෝ යන දෙකින් අඩු කාල සීමාවේදී මුදල් බවට උපලබ්ධි වන ඒවාය.

2.2 මූල්‍ය සාධන පත්‍ර

2.2.1 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

මූල්‍ය වත්කම් පහත සඳහන් කොටස් වලට වර්ගීකරණය කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කළ දෑ , ණය සහ ලැබිය යුතු දෑ , කල් පිරෙන තුරු හෝ විකිණීමට තිබෙන දෑ , මෙම වර්ගීකරණය කළමනාකරණය විසින් නීර්ණය කරන ලද්දේ මුලික හඳුනා ගැනීම හා එම ආයෝජන අත්පත් කර ගැනීමේ අරමුණ පදනම් කොට ගෙනය.

2.2.2 වර්ගීකරණය , හඳුනා ගැනීම සහ මැනීම.

කළමනාකරණය විසින් එහි මූල්‍ය වත්කම් පහත සඳහන් ලෙස වර්ගීකරණය කරයි.

අ. ණය සහ ලැබිය යුතු දෑ

ආ. විකිණීම සඳහා ඇති දෑ

අ. ණය සහ ලැබිය යුතු දෑ

ස්ථාවර හෝ සක්‍රීය වෙළෙඳපොලේ මිළ ප්‍රකාශ නොවන, තීරණය වූ ගෙවීම් සහිත මූල්‍ය වත්කම්ය. මෙම වත්කම් මුලින්ම සාධාරණ වටිනාකමට එකතු වූ ඍජුවම අදාල වන ගණුදෙනු පිරිවැය හඳුනා ගනු ලැබේ. පසුකාලීනව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය කිරීමත් , යම් හානිකරණ පාඩුවක් වේනම් එයත් සැලකිල්ලට ගෙන මනිනු ලැබේ.

ආ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු නිශ්චිත නොවූ කාල පරිච්ඡේදයක් තබා ගැනීමට අදහස් කරන , ද්‍රවශීලතා හේතු හෝ පොලී අනුපාත වෙනස්වීම මත , විනිමය අනුපාත වෙනස්වීම මත හෝ ස්කන්ධ මිළ මත විකිණීමට අවශ්‍ය විය හැකි හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති කල් පිරෙන තුරු තබා ගන්නා හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්ය.

2.2.3 සාධාරණ අගය නිශ්චය කිරීම.

ණය සහ අත්තිකාරම් මෙන්ම වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීමේදී වර්තමාන අගය ආකෘතිය එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කොට ගෙන ණයෙහි ගුණාත්මකභාවයද , ද්‍රවශීලතාව හා පිරිවැයද සැලකිල්ලට ගෙන නිර්ණය කෙරේ. වෙළෙඳ ලැබිය යුතු හා ගෙවිය යුතු අයිතම වල ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙන්නේ පවත්නා වටිනාකමින් හානිකරණය සඳහා අඩු කළ පසු ඉතිරියයි.

2.2.4 ප්‍රති වර්ගීකරණය

ණය හා ලැබිය යුතු දෑ හැර මූල්‍ය වත්කම් , වෙළඳාම සඳහා අයිතමයන්ගෙන් වෙන් කොට වර්ගීකරණය කිරීමට ඉතා කලාතුරකින් ඇතිවිය හැකි පරිසරයකදී හුදෙකලා සිදුවීමක් ලෙස අවසර දෙනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ අතරින් වෙළඳාම සඳහා වූ දේ ලෙස ප්‍රති වර්ගීකරණය කිරීම සංස්ථාව විසින් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අදාළ වන්නේ නම් ප්‍රතිවර්ගීකරණය තෝරා ගනු ඇත.

ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එසේ කරන දිනට ඇති සාධාරණ අගයටයි. සාධාරණ අගය වන්නේ නව පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය මතය.

2.2.5 හානිකරණය

(අ) ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වී ඇති බවට වන සාක්ෂි සංස්ථාව විසින් අගය කෙරේ. වත්කමෙහි ආරම්භක හඳුනා ගැනීමෙන් පසු ඇති වූ අවස්ථා එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස (දරන ලද අලාභ අවස්ථා) අගය අඩුවීමක පරමාර්ථ සාක්ෂියක් තිබේනම් සහ එම අලාභ අවස්ථාවට මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ හෝ විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම් කාණ්ඩයක් මත බලපෑමක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වූ බවට සලකනු ලැබේ. අගය අඩුවන බවට වන සාක්ෂි ලෙස , ණයකරුවෙකු හෝ ණයකරුවන් කාණ්ඩයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා වලට මුහුණ දෙමින් සිටින බව පෙන්වීම , පොළියෙහි හෝ මූලධන ගෙවීම් වල පැහැර හැරීම් , ඔවුන් බංකොලොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඇති හැකියාව සහ පැහැර හැරීම් සමඟ සහසම්බන්ධිත ආර්ථික තත්ත්ව හෝ හිඟ මුදල් වල වෙනස්වීම් වැනි

ඇස්තමේන්තුගත අනාගත මුල්‍ය ප්‍රවාහ වල ඇඟයිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත මින් පෙන්වීම , ඇතුළත් විය හැකි වේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සඳහා , තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනි වශයෙන් අගය අඩුවීම්හි පරමාර්ථ සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් පළමුවෙන් තනි තනි වශයෙන් අගයන අතර , තනි තනි වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමුහිකව අගයයි. වැදගත් වුවත් , නොවුවත් තනි තනි වශයෙන් අගයනු ලැබූ මූල්‍ය වත්කමක අගය අඩුවීම පිළිබඳ පරමාර්ථ සාක්ෂියක් නොමැති බව සමුහය විසින් නිශ්චය කළහොත් එය, එම වත්කම සමාන බැර අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩයක ඇතුළත් කරන අතර ඒවා අගය අඩුවීම සඳහා සාමුහිකව අගයනු ලැබේ. අගය අඩුවීම සඳහා තනි තනි වශයෙන් අඟයනු ලැබූ සහ අගය අඩුවීමක් සහිත හෝ දිගින් දිගටම හඳුනා ගැනීමට නියමිත වත්කම් අගය අඩුවීමෙහි සාමුහික ඇගයීමට ඇතුළත් කරනු නොලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ වත්කම් මත අගය අඩුවීමේ අලාභ දරා ඇති බවට පරමාර්ථ සාක්ෂියක් ඇති විට , වත්කමෙහි පවතින වටිනාකම සහ මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායී පොළි අනුපාතිකයට වට්ටම්ගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල වර්තමාන වටිනාකම (නොදරන ලද අනපේක්ෂිත අනාගත ණය අලාභ හැර) අතර වෙනසින් අලාභයෙහි ප්‍රමාණය අගයනු ලැබේ. ණයක් සඳහා වෙනස් වන පොළි අනුපාතියක් පවතීනම් යම් අගය අඩුවීමේ අලාභයක් ඇගයීම සඳහා වට්ටම්ගත අනුපාතය වන්නේ වර්තමාන ඵලදායී පොලී අනුපාතයයි. වත්කමෙහි පවතින වටිනාකම දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා අඩු වන අතර , හානිවන ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. පොලී ආදායම . අඩු වූ පවතින වටිනාකම මත එක්රැස් වීම පවත්වා ගෙන යනු ලබන අතර එය අගය අඩු වීමේ අලාභ ඇගයීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කළ පොලී අනුපාතය භාවිතා කරමින් එක් රැස් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි ආයෝජන ආදායම් වල කොටසක් ලෙස පොලී ආදායම වාර්තා කරනු ලැබේ.අනාගත අය කර ගැනීමෙහි තාත්වික අපේක්ෂාවන් නොමැති විට ආශ්‍රිත දීමනා සමඟින් ණය කපා හරිනු ලබන අතර , සියලු සුරැකුම් සමුහයට උපලබ්ධි කර හෝ පවරාගෙන ඇත. ආසන්න වර්ෂයකදී අගය අඩුවීම හඳුනා ගැනීමෙන් පසු යම් හේතුවක් නිසා ඇස්තමේන්තුගත අගය අඩුවීමේ අලාභය වැඩි වේ නම් හෝ අඩු වේ නම් දීමනා ප්‍රමාණය සීරුමාරු කර පෙර හඳුනා ගනු ලැබූ අගය අඩුවීමේ අලාභය වැඩි හෝ අඩු කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අය කර ගතහොත් එම අය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි දීමනා (Allowance) ගිණුමට ගලපනු ලැබේ.

(ආ) අනෙකුත් මුල්‍යමය නොවන වත්කම් හානිකරණය

වත්කමක පවත්නා අගය අය කර ගත නොහැකි බව පෙනෙන පරිසරයකදී හානිකරණය සඳහා විමසා බැලීමට යටත් වේ. පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේ නම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ.

2.2.6 හඳුනා ගැනීම අත් හැරීම.

මුල්‍ය වත්කමක් (හෝ කොටසක් හෝ සමුහයක කොටසක් ඇතුලුව) හඳුනා ගැනීම අත් හරින අවස්ථා මෙසේය.

- මුල්‍ය ප්‍රවාහයන් ලැබීමේ අයිතිය ඉකුත් වීම.
- සංස්ථාව විසින් වත්කම මඟින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය පැවරීම හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් තුන්වන පාර්ශවයකට පවරා දිය යුතු යැයි උපකල්පනය කිරීම.

(අ)සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීම.
(ආ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීමක් හෝ රඳවා ගැනීමක් නොකොට පාලන අයිතිය පැවරීම.

2.2.7නීතිමය අයිතියක් ඇති අවස්ථා වල මුල්‍ය වත්කම් හා වගකීම් සමාහරණය කොට ශුද්ධ අගය දක්වා ඇත.

2.2.8 කොටස් ආයෝජනය

සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ රු.6.35 බැගින් වූ කොටස් 20,000ක් ආයෝජනය කර ඇත.

2.3.දේපළ , යන්ත්‍ර හා උපකරණ

2.3.1හඳුනා ගැනීම හා මැනීම.

දේපළ , යන්ත්‍ර හා උපකරණ අයිතමයන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ තක්සේරු අගයට පෙන්වා ඇත. පිරිවැය තුළ වත්කම අත් කර ගැනීමේදී දැරූ වියදම් වලින් සෘජුවම අදාල වන වියදම් ඇතුලත් වේ. ස්වයං නිර්මිත වත්කම් වල එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ ද්‍රව්‍යය පිරිවැය , සෘජු ශ්‍රමය , සෘජුවම බලපාන වෙනත් අදාල වියදම් ඇතුළත් වේ. අළුත්වැඩියා හා ඉදිරි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් දරන ලද වියදම් ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

2.3.2පසුකාලීන පිරිවැය

උපාංග ප්‍රතිපූර්ණය සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව එනම් පුළුල් පරීක්ෂාවන් හා පූර්ණ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනගත කෙරෙන්නේ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හේතු වන්නේනම් හා එම ප්‍රතිලාභ විශ්වාසදායකව මැනිය හැකි නම්ය. දෛනික සේවා කිරීම් ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

2.3.3ක්ෂය වීම්

ක්ෂය සඳහා වෙන් කිරීම සරල මාර්ගක්‍රමය අනුව පිරිවැය/තක්සේරු අගය මත ගණනය කෙරේ. ඉඩම් හැර දේපළ , යන්ත්‍ර හා උපකරණ පහත දැක්වෙන ප්‍රතිශත අනුව ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ශේෂය ගණනය කෙරේ.

ගොඩනැඟිලි	-	ප්‍රධාන කාර්යාලය	2.5%
	-	ශ්‍රවණාගාරය	5%
චිත්‍රපට සංකීර්ණය	-	ගොඩනැඟිලි	5%
	-	අනෙකුත් යන්ත්‍ර සූත්‍ර	10%
ලී බඩු සවි කිරීම්			10%
මෝටර් රථ			25%
චිත්‍රපට සංරක්ෂණාගාරය			10%
සංස්කෘතික / අධ්‍යාපනික / චිත්‍රපට උපකරණ			10%
චිත්‍රපට උපකරණ			10%
සුභසාධන උපකරණ			10%

දේපළ පිරියත හා උපකරණ මිළදී ගත් දිනෙන් ආරම්භව ක්ෂය කරනු ලැබේ.

2.3.4 හඳුනා ගැනීම ඉවත් කිරීම.

දේපළ , පිරියත සහ උපකරණ අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ ඒවායින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර වේ. දේපළ , පිරියත හා උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට අදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීමක කිසියම් ඇගවීමක් තිබේදැයි නිශ්චය කිරීම සඳහා විලම්භීත බදු වත්කම් හාර සමුහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම් ඒ ඒ වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලැබේ. එවැනි තත්ත්වයක් ඇත්නම් , එවිට වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායි ආයු කාලයක් සහිත හෝ මේ වන තෙක් භාවිතය සඳහා නොපවතින අස්පෘශ්‍ය වත්කම් සඳහා අය කර ගත හැකි වටිනාකම එක් එක් වර්ෂයේදී එම අවස්ථාවේදීම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම (Value in use) ඇගයීමේදී , මුදලෙහි කාලීන අගයෙහි වර්තමාන වෙළෙදපොල ඇඟයීම පිළිබිඹු කරනු ලබන බදු පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට හෝ මූල්‍ය උත්පාදක ඒකකයට විශේෂිත අවදානම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

අගය අඩුවීම පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් වෙනත් වත්කම් වලින් මුදල් ගැලීමෙන් විශාල වශයෙන් නිදහස් වන නොකඩවා පාවිච්චියෙන් මුදල් ගැලීම උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට කාණ්ඩගත කරනු ලැබේ. අගය අඩුවීමේ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

*වත්කම් උපලේඛනයේ සඳහන් චිත්‍රාගාරයේ ඇති රු.1 අගයට ක්ෂය කර ඇති වත්කම් භාණ්ඩ තව දුරටත් කෞතුක භාණ්ඩ වශයෙන් පවත්වා ගෙන යනු ලබයි.

2.3.6 අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගැනීම

2020 වර්ෂයේදී පහත අයිතමයන් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගෙන වියදමක් ලෙස ගිණුම් ගත කරන ලදී.

	රු
ශබ්දාගාරය සඳහා ශබ්ද මිශ්‍රණය 5.1	1,207,350.00
පරිගණක මෘදුකාංග	480,000.00
	1,687,350.00

* 2005 වසරේදී රු.මි. 4.9 ක වටිනාකමකට මිලදී ගන්නා ලද සරසවි චිත්‍රාගාරයේ ස්ථාපිත කර ඇති වීඩියෝ සංස්කරණ පද්ධතිය (Video Editing System) අස්පෘශ්‍ය වත්කමක් ලෙස 2020 වසරේදී හඳුනා ගන්නා ලද අතර 2005 වසරේදී වියදමට ගෙන ඇත.

2.4 නොනිමි ප්‍රාග්ධනය

ගොඩනැගිලි

*BAW ජයමාන්න මැදිරිය :- BAW ජයමාන්න මැදිරියේ නවීකරණ කටයුතු නිමකරමින් පවතී.

*ලෙස්ටර් ජේම්ස් පීරිස් කෞතුකාගාරය :- අදියර 3කින් කාර්යයන් නිම කිරීමට අපේක්ෂිත අතර මේ වන විට පළමු අදියරයේ කාර්ය කොටසක් නිම කර ඇත.

වායුසමීකරණ

සංස්ථාවේ නව ගොඩනැගිල්ලේ අංශ තුල වායුසමීකරණ ස්ථාපිත කිරීමේ කටයුතු නිම වී නොමැත.

2.5 තොග

සියළු තොග පිරිවැය හෝ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය යන දෙකින් අවමයට අගය කෙරේ. පිරිවැය පළමු ඇතුළු - පළමු පිට (FIFO) ක්‍රමය පදනම් කොටගෙන තීරණය කෙරේ.

2.6 ආදායම් බදු

සංස්ථා සේවකයන්ගේ පඩි හා අනෙකුත් දීමනාද , වියදම් වලින් කොටසක් පියවීම සඳහාද , භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනු ලැබේ. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා බදු නොගෙවිය යුතුය යන පදනම මත බදු ගෙවීම සඳහා වෙන් කිරීමක් කර නොමැත.

සංස්ථාව විසින් වාර්ෂිකව ලැබූ ලාභය ආදායම් බදු ගෙවීමෙන් පසු ඇති වූ අතිරික්තයෙන් 24% ක ප්‍රමාණයක් ලාභය වෙනුවෙන් බදු ගෙවිය යුතුය යන්න අපගේ මතය වන අතර , එම ප්‍රමාණය විය යුත්තේ ආදායම් බදු සඳහා සිදු කළ ගැලපුම් කටයුතු වලින් පසු ඉතිරි ශුද්ධ ලාභය යන්න අපගේ විශ්වාසයයි.

2.7 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් වල අනෙකුත් ණයගැතියන් සහ ලැබිය යුතු දෑ , අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවීම් , ලැබිය යුතු බදු ඇතුළත් වේ.

(අ) අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවූ වියදම්

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ ලැබෙතැයි පෙනෙන යම් සම්බන්ධතාවයක් ඇති වියදම් අත්තිකාරම් , තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කරන ලදී. එවැනි වියදම් කාල පදනම මත අදාළ කාල පරිච්ඡේදය තුළ කපා හරිනු ලැබේ.

(ආ) අනෙකුත් ණයගැතියෝ

අනෙකුත් ණයගැතියන් පිරිවැයෙන් හානිකරණය අඩු කළ වටිනාකමට හඳුනාගෙන ඇත.

2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ

ඒවායේ සාධාරණ අගයෙහි වෙනස්වීමට නොසැලකිය යුතු තරමේ අවදානමකට භාජනය වන අත්පත් කර ගත් දින සිට මාස 03 ක් කල් පිරුණු හෝ ඊට අඩු කල් පිරීමක් සහිත සහ සමුහය විසින් එහි කෙටිකාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගන්නා මුදල් ශේෂ සහ ඉල්ලුම් තැන්පතු වලින් මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වේ.

භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රති විකුණුම් බිල්පත් ගිණුම් ගත කිරීමේදී මාස 03 ක් හෝ ඊට අඩු ආයෝජනයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා සමාන ද්‍රවශීල වත්කමක් ලෙස පෙන්වා ඇත.

2.9 මුල්‍ය වගකීම්

2.9.1ආරම්භක හඳුනා ගැනීම හා මැනීම.

LKAS 39 අනුව මුල්‍ය වගකීම් වර්ග කොට ඇත්තේ , උචිත පරිදි ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයට මනින ලද මුල්‍ය වගකීම් හෝ ණය හෝ ණයට ගැනීම්ය. සංස්ථාව එහි මුල්‍ය වගකීම් ආරම්භක හඳුනා ගැනීම අනුව වර්ගීකරණය නිශ්චය කර ඇත. සියළු මුල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර , ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ක්‍රමය භාවිතා කරයි. මෙහි සෘජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.

සංස්ථාවේ මුල්‍ය වගකීම් වල වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුලත්ය.

2.9.2 පසුකාලීන මිනුම්

මුල්‍ය වගකීම් මිනුම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

2.9.3 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මුල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මුල්‍ය වගකීම් වල වෙළඳාම සඳහා වූ මුල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මුල්‍ය වගකීම් මත නම් කරන ලද ඒවා ඇතුළත් වේ. මුල්‍ය වගකීම් , වෙළඳාම සඳහා පවත්නා දේ ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා නුදුරේදී විකිණීමේ අරමුණ ඇත්නම්ය. වෙළඳාම සඳහා වගකීම් මත ලැබීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. සංස්ථාව කිසිදු මුල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මුලික හඳුනා ගැනීම නම් කර නැත.

2.10 අනෙකුත් මූල්‍ය වගකීම්

ණය සහ ණය ගැනුම් ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අනෙකුත් මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ක්‍රමාක්ෂය ක්‍රමය භාවිතා කරයි.

උපචිත වියදම්

	රු
ගෙවීමට ඇති වැටුප්	4,293,407.75
වෙනත් වියදම්	12,977,018.08
සිනමා කෞතුකාගාරය	1,605,531.14
BAW ජයමාන්න මැදිරිය	9,064,035.20
වායු සමීකරණ යන්ත්‍ර	5,773,067.60
හිඟ ඊ.පී.එෆ් /ඊ.ටී.එෆ්	16,027,801.81
අන්තර්ජාල පහසුකම් සැපයීම	1,357,000.00
	51,097,861.58

2.11අනෙකුත් වගකීම්

අනෙකුත් වගකීම් වල උපචිත වියදම් ද ඇතුලත්ය. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස වටිනාකමට දක්වා ඇත.

* වෙනත් ණය හිමියන් යටතේ දක්වන ලද ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල මඟින් දක්වා ඇත්තේ චිත්‍රපට සංවර්ධන අරමුදල මඟින් නිශ්පාදනය කරනු ලැබූ "වෑකන්ද වලව්ව" චිත්‍රපටය

විසින් සංස්ථාව මිලදී ගැනීම නිසා ඒ වෙනුවෙන් අරමුදල වෙත ගෙවිය යුතු මුදලයි.

2.12 රජයේ ප්‍රදාන

වත්කම් වලට අදාළ රජයේ ප්‍රදාන මේවා ශේෂ පත්‍රයේ විලම්භනය කර අදාළ වත්කමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබන අතර , වියදම් පියවීම සඳහා ලැබෙන්නා වූ ලැබීම් , ලැබීම් පදනම මත ගිණුම්ගත කෙරේ.

භාණ්ඩාගාර ප්‍රදානයන් භාවිතය සමඟ නිසි පරිදි ආදායමට හඳුනා ගැනීම.

LKAS 20 අනුව වත්කම් ගොඩනැගීමට අදාලව රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් වත්කමෙහි ආයු කාලය පුරා ආදායමට හඳුනා ගැනීම 2019 වර්ෂයට හඳුනා ගත් ආදායම් පහත සඳහන් වේ.

	රු.ශත
ශබ්ද උපකරණ	425,437.56
ශබ්ද උපකරණ	43,114.42
35 මිමි ප්‍රක්ෂේපන යන්ත්‍රය	135,600.78
නව ගොඩනැගිල්ල	1,308,864.03
ගොඩනැගිල්ල - ප්‍රධාන කාර්යාලය	4,226,511.50
සිනමා ස කීර්ණය	5,067,024.04
අන්තර්ජාල පහසුකම්	135,700.00
වැඩ කණ්ඩායම්	149,945.28
	11,492,197.61

ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු මුදල - **රු. 90,000,000.00**

ආයතනයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු මුදල - **රු. 15,000,000.00**

2.13 සේවක ප්‍රතිලාභ

නිර්ණය කළ දායක සැලැස්ම

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාර , සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ හිමිකම් ලබති. සංස්ථාව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත ස්ථාවර දායකයක් මෙකී අරමුදල් වලට ගෙවන අතර , ඉන් අමතරව නීතිමය හෝ හෝ අර්ථකාරී බැඳීමක් සංස්ථාව කෙරෙහි නොමැත.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වෙනස් වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලසුමක් වේ. මේ සම්බන්ධව 1983 අංක.12 දරන පාරිතෝෂික පනත යටතේ සංස්ථාව බැඳී සිටී.

2.14 ආදායම

2.14.1 ප්‍රධාන ආදායම් මූලාශ

01. දේශීය හා විදේශීය චිත්‍රපට බෙදා හැරීමේ කොමිස්

දේශීය හා විදේශීය චිත්‍රපට බෙදාහැරීමේදී චක්‍රලේඛ ප්‍රකාරව සංස්ථාව විසින් අයකරනු ලබන කොමිස් මුදල වේ.

02. වැඩිවීම - සංස්ථා භාරය

චිත්‍රපට ප්‍රදර්ශනයේදී එක් ප්‍රවේශ පත්‍රයකින් රු.6 ක මුදලක් අය කරනු ලබයි.එයින් රු. 3.10ක මුදලක් සංස්ථාවට ලැබිය යුතු අතර විදේශීය චිත්‍රපටයකින් එම සම්පූර්ණ රු.3.10 මුදල ද, දේශීය චිත්‍රපටයකින් ලැබෙන රු.3.10 න් රු..40 ක මුදලක්ද අයකරනු ලබයි.

03. අධිභාරය

සිනමාශාලා වලින් ලැබිය යුතු චිත්‍රපට කුළිය සඳහා අයවිය යුතු අධිභාර මුදලින් 100% ක් නොලැබේය යන පදනම මත 25% ක් පමණක් ආදායමට ගෙන තිබේ. 2020 ඔක්තෝබර් මස සිට එම 2.5% මුදල 1% වශයෙන් සංශෝධනය වී ඇත.

04. පරීක්ෂණ දඩ මුදල්

සිනමාශාලා වල සිදු වී ඇති අක්‍රමිකතා මත අය කරනු ලබන දඩ මුදල වේ.

05. ප්‍රචාරණය සඳහා කොමිස් හා සේවාවන් සඳහා කොමිස්

චිත්‍රපටවල හා සිනමාශාලා වල ප්‍රචාරණ කටයුතු සංස්ථාව මඟින් ඉටු කිරීමෙන් නියෝජිත ආයතන මඟින් සංස්ථාව අය කරනු ලබන කොමිස් හා සේවා ගාස්තු වේ.

06. චිත්‍රාගාර ආදායම්

චිත්‍රපට වල පසු නිශ්පාදන කටයුතු (ශබ්ද හා සංස්කරණ කටයුතු) සඳහා චිත්‍රාගාර සේවා ලබා දීමෙන් අය කරනු ලබන අදායම් වේ.

2.14.2 නිෂ්පාදක ණය පොලිය හා අධි භාරය

නිෂ්පාදකයින් වෙත ලබා දී ඇති ණය මුදල් සඳහා පොළිය ගිණුම්ගත කර ඇත්තේ අදාළ චිත්‍රපට ප්‍රදර්ශනය වී අවුරුද්දක් ගත වන තෙක් පමණි. යම් අවස්ථාවක ණය මුදල් සම්පූර්ණ අය වන්නේනම් අදාල පොලියද ගණනය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ.

සිනමාශාලා වලින් අය වීමට ඇති මුදල් සඳහා ගැසට් නිවේදනයේ පරිදි අධිභාරය ගණනය කර ගිණුම්ගත කර තිබේ.

2020 වසර තුලදී චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී නොමැත.

2.14.3 ප්‍රදර්ශනය සඳහා මුදා හැර ඇති චිත්‍රපට

චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේදී ආදායම නොලැබීම මත ණය මුදල් අය නොවීමේ තත්ත්වයක් තුළ චිත්‍රපට මුදා හැර වසරකට පසු පොළිය ගිණුම්ගත කරනු නොලැබේ.

2.14.4 ප්‍රදර්ශනය නොවූ චිත්‍රපට

(අ)චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී ඇති එහෙත් පසුගිය වර්ෂ දෙකක සේවාවන් ලබාගෙන නොමැති චිත්‍රපට වලට පොළිය ගිණුම්ගත කර නොමැත.

(ආ)චිත්‍රාගාර සේවා ලබා දීමේදී දීර්ඝ කාලයක් තුළ සේවාවන් ලබා නොගෙන නිෂ්පාදන කටයුතු නවතා ඇති චිත්‍රපට සඳහා පොළිය ගිණුම්ගත කොට නොමැත.

ඉහත සඳහන් කරුණු 02 යටතේ වර්ෂයේ පොළිය ගණනය නොකලද , යම් අවස්ථාවක මෙම ණය මුදල් අය කර ගැනීමේදී පොළිය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.14.5 224ගොඩනැගිලි කුලී ආදායම

සංස්ථාවට අයිති වත්කමක් වන 224 ගොඩනැගිල්ල තාවකාලිකව කුලීයට දීමෙන් පහත ආයතනයන්ගෙන් ගොඩනැගිලි කුලි අයකරනු ලබයි.

		මාසික කුලිය	වාර්ෂිකව
01	සැලසිනේ ආයතනය	315,000.00	3,780,000.00
02	ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය	80,000.00	960,000.00
03	සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය	345,000.00	4,140,000.00
		740,000.00	8,880,000.00

2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී 224 ගොඩනැගිල්ලේ සැලසිනේ ආයතනයේ හා සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ මාසික කුලී ආදායම පිලිවෙළින් රු.23,500.00 කින් හා රු.30,000.00 කින් වැඩිවී ඇත.

2.14.6 සංස්ථා ගිණුමට ඇතුළත් නොවූ ව්‍යාපෘති

01.ළමුන් සඳහා සිනමා අධ්‍යාපනය (Film Education for School Children)

ලංකා බැංකු ජංගම ගිණුම් අංක - 5152460

ළමුන් සඳහා වූ සිනමා අධ්‍යාපනය යටතේ වූ ව්‍යාපෘතිය සඳහා සිලෝන් බිස්කට් සමාගම මගින් පරිත්‍යාග කරන ලද රු.976,303.16 මුදල මෙම වසරේදී කිසිදු ව්‍යාපෘති කටයුත්තකට නොයෙදූ බැවින් වැඩි ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා රජයේ බැංකු කිහිපයකටම බැංකු පොලී අනුපාත සසඳා බලා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන 5.25% පොලියකට ලංකා බැංකුවේ ආයෝජනය කරන ලදී. යම් හෙයකින් 2021 වසරේදී එම ව්‍යාපෘති කටයුත්ත ආරම්භ කරනු ලැබුවහොත් එම මුදල නැවත යෙදවීමට කටයුතු කරයි.

2.15 පෙර වර්ෂයේ ලාභයට ගැලපීම

ගණුදෙනුවේ ස්වභාවය	හර (රු.)	බැර (රු.)	ශේෂය (රු.)
2019 වසරේ පරිගණක ගත චිත්‍රපට කුලී ණයහිමි ශේෂ නිවැරදි කිරීම. (RJ/01,RJ/02,RJ/03,RJ/11,RJ/12-RJ/28, RJ/30,RJ/36, RJ/42)	28,139.64	1,733.28	26,406.36
2019 වසරේ ප්‍රමාදව ලද දෛනික වාර්තා සටහන් කිරීම. (RJ/04-RJ/10,RJ/29,RJ/,RJ/38)	-	5,274.08	(5,274.08)
ණයහිමි, ණයගැති ශේෂ නිවැරැදි කිරීමේදී ගිණුම්ගත කර ඇති අධිභාර ඉවත් කිරීම. (GL/18,RJ/45)	261,671.61	-	261,671.61
පෙර වර්ෂවල ආදායම් වියදම් ගිණුම්වල වැරදි නිවැරදි කිරීම. (RJ/46,GL/21,GL/22,GL/32,GL/45,GL/46,GL/62-GL/67,GL/76,GL/79,GL/81,GL/85,GL/87,GL/89, GL/91,GL/102,GL/103,GL/105-G/L11,GL/113,GL/114,GL/118-GL/121,GL/123) Rithma RJ/14,RJ/15,RJ/16,RJ/19,RJ/45,RJ/46	1,170,873.68	9,319,371.94	(8,148,498.26)
2020 ස්ථාවර වත්කම් හඳුනාගැනීමේදී පෙර වර්ෂවල ක්ෂය ඉවත් කිරීම් වලට අදාල සටහන් යෙදීම. (GL/124,GL/125,GL/127,GL/129)	480,000.00	288,614.69	191,385.31
			(7,674,309.06)

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩලය - 2020

අනු අංකය	නම	තනතුර	පත්වීම් දිනය
1	ආචාර්ය ජයන්ත ධර්මදාස	සභාපති	2020.01.01
2	*රොහාන් වැලිවිට මහතා	ක්‍රියාකාරී අධ්‍යක්ෂ	2020.01.01
3	නාලක කළුවැව මහතා	ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්	2019.12.24
4	චන්ද්‍රපාල ලියනගේ මහතා	අධ්‍යක්ෂ ජනරාල්	2020.01.21
5	තරණි අනෝජා ගමගේ මහත්මිය	සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ	2020.01.21
6	ආචාර්ය ධම්මික දිසානායක	කථිකාචාර්ය - සෞන්දර්ය විශ්ව විද්‍යාලය	2020.01.21
7	ආචාර්ය රවීන්ද්‍ර රන්දෙණිය	ප්‍රවීණ රංගන ශිල්පී	2020.01.21
8	ධම්මිත් ෆොන්සේකා මහතා	ප්‍රවීණ රංගන ශිල්පී	2020.0121
9	වසන්ති චතුරානි මහත්මිය	ප්‍රවීණ රංගන ශිල්පිනී	2020.01.21
10	ඩී.සී. ජයදේව මහත්මිය (භාණ්ඩාගාර නියෝජිත)	අධ්‍යක්ෂ - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	2020.01.21
11	එස්.ටී. කොඩිකාර මහතා	ලේකම්, ජාතික උරුම ප්‍රසංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු අමාත්‍යාංශය	2020.10.15

*රොහාන් වැලිවිට මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීම 2020.05.12 දින සිට අවසන්ව ඇත.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020.12.31දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

		2020	2019
(03) විකුණුම්		රු.	රු.
(සටහන 2.14.1)			
චිත්‍රපට බෙදා හැරීමේ ආදායම්	**3.1**	15,290,403	46,907,845
ප්‍රචාරක ආදායම්	**3.2**	261,727	477,596
චිත්‍රාගාරය	**3.3**	1,284,972	1,687,900
වෙළඳ කටයුතු	**3.4**	816,570	1,727,133
		17,653,672	**50,800,475**

3.1 චිත්‍රපට බෙදා හැරීමේ ආදායම්

දේශීය චිත්‍රපට සඳහා කොමිස්	4,111,913	12,550,578
විදේශීය චිත්‍රපට සඳහා කොමිස්	7,316,881	20,609,406
වැඩිවීම -සංස්ථාහාරය	1,278,847	7,915,187
අධිභාරය	2,311,291	4,894,982
පරීක්ෂණ දඩ මුදල්	271,470	756,840
	15,290,403	46,907,845

3.2 ප්‍රචාරක ආදායම්

ප්‍රචාරණය සඳහා කොමිස් -සිනේ ඇඩ්ස්	193,859	477,596
සේවාවන් සඳහා කොමිස්	67,868	
	261,727	477,596

3.3 චිත්‍රාගාරය

ශබ්ද	1,282,772	1,687,900
සංස්කරණය	2,200	-
	1,284,972	1,687,900

3.4 වෙළඳ කටයුතු

සිනමා කාබන්	70,300	160,675
අමතර කොටස්	87,160	5,696
ලිපිද්‍රව්‍යය හා ප්‍රසිද්ධ කිරීම්	598,160	1,465,421
අභ්‍යන්තර භාවිතය		
අමතර කොටස්	-	9,469
ලිපි ද්‍රව්‍යය පිරිවැය	60,950	85,872
	816,570	1,727,133

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04) විකුණුම් පිරිවැය

	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	නිෂ්පාදන	පොදු පරිපාලන වියදම්	2020 එකතුව	2019 එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
තොගය 2020.01.01	5,253,887	1,409,412	-	4,637,934	11,301,233	11,819,532
එකතු කළා :						
මිලදී ගැනීම් හා මාරු කිරීම්	-	-		634,613	634,613	3,905,932
	5,253,887	1,409,412	-	5,272,547	11,935,846	15,725,464
අඩු කළා :						
තොග පාඩුවීම්	-					
මාරු කිරීම්	-					
2020.12.31 අවසන් තොගය	5,253,887	1,409,412	-	5,214,684	11,877,983	11,301,233
	-	**-**	**-**	**57,863**	**57,863**	

දීර්ඝ සටහන් සඳහා (4- ඒ) , (4-බී) සහ (4- සී) සටහන් බලන්න.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2020.12.31 දිනට අවසන් වර්ෂයේ

ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04 - A) විකුණුම් පිරිවැය

ප්‍රදර්ශන		තොගය 2020.01.01	මිල්දී ගැනීම්	එකතුව	තොගය 2020.12.31
		රු.	රු.	රු.	රු.
එළිය කැවූ චිත්‍රපට					
දේශීය		3	-	3	3
බටහිර		244	-	244	244
පෙරදිග		471	-	471	471
		718	-	718	718
මුදා නොහල චිත්‍රපට					
දේශීය		3,043,931	-	3,043,931	3,043,931
බටහිර		982,492	-	982,492	982,492
පෙරදිග		8	-	8	8
එකතුව		4,026,431	-	4,026,431	4,026,431
		4,027,149	-	4,027,149	4,027,149

		2020		2019
		රු.		රු.
තොගය 2020.01.01		-		-
එකතු කළා :	මිල්දී ගැනීම්	-		-
	ප්‍රචාරණය	-		-
		-		-
අඩු කළා :	තොගය			
	2020.12.31	-		-
	පිරිවැය	-		-
එකතු කළා:	අනෙකුත් චිත්‍රපට			
තොගය 2020.01.01				
I. ප්‍රතිශත පදනම මත		259,890	-	259,890	
II. සිනේ සිත්තම්		966,848	1,226,738	966,848	1,226,738
එකතු කළා :	වියදම්		-		-
			1,226,738		1,226,738
අඩු කළා :					
	මාරු කිරීම්				
තොගය 2020.12.31					
I. ප්‍රතිශත පදනම මත		259,890	-	259,890	-
II. සිනේ සිත්තම්		966,848	1,226,738	966,848	1,226,738
මුළු පිරිවැය			-	-	-

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2020.12.31 දිනට අවසන් වර්ෂයේ

ආදායම් ප්‍රකාශන සඳහා සටහන් (පොදු පරිපාලන)

(04 - B) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍යය	ලිපි ද්‍රව්‍යය	එකතුව 2020	එකතුව 2019
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය 2020.01.01	287,951	1,018,492	267,748	-	3,063,743	4,637,934	5,156,233
එකතු කළා :							
මිලදී ගැනීම් හා මාරු කිරීම්	-	-	-	-	634,613	634,613	3,905,932
	287,951	1,018,492	267,748	-	3,698,356	5,272,547	9,062,165
අඩු කළා :							
තොග හානිවීම							
2020.12.31 අවසන් තොගය	287,951	991,233	266,683	-	3,668,817	5,214,684	4,637,934
	-	**27,259**	**1,065**	-			

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2020.12.31 දිනට අවසන් වර්ෂයේ

ආදායම් ප්‍රකාශන සඳහා සටහන් (චිත්‍රාගාරය)

(04 - C) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍යය	එකතුව 2020	එකතුව 2019
	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය - 2020.01.01	816,569	-	538,753	54,090	1,409,412	1,409,412
මිලදී ගැනීම්	-	-	-	-	-	-
	816,569	-	538,753	54,090	1,409,412	1,488,344
අඩු කළා :						
තොග හානිවීම	-	-	-	-	-	-
මාරු කිරීම්	-	-	-	-	-	-
2020.12.31 අවසන් තොගය	816,569	-	538,753	54,090	1,409,412	1,409,412
වර්ෂය තුළ අභ්‍යන්තර පාවිච්චිය	-	-	-			

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 05

	2020	2019
	රු.	රු.
සේවක පාරිශ්‍රමිකය		
වැටුප් හා වේතන	56,582,591	53,681,072
අතිකාල, නිවාඩු පඩි හා වන්දි	3,195,671	9,307,207
සේවක අර්ථසාධක හා භාරකාර අරමුදලට දායක මුදල්	11,484,865	10,238,526
වෙනත් දීමනා	20,479,225	16,702,755
	91,742,352	89,929,560

සටහන : 06

ගමන් හා යැපීම් දීමනා

ගමන් වියදම්	(දේශීය)	62,254	61,439
	(විදේශීය)	-	524,890
යැපීම් දීමනා		409,378	799,720
		471,632	1,386,049

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 07

	2020	2019
	රු.	රු.
සැපයුම් හා උපකරණ		
ලිපි ද්‍රව්‍යය හා කාර්යාලීය උපකරණ	756,815	2,732,085
විදුලිය	4,071,635	5,888,347
සංග්‍රහ වියදම්	211,101	478,310
විදුලි උපකරණ	64,148	43,867
	5,103,699	9,142,609

සටහන : 08

අළුත්වැඩියා කිරීම් , නඩත්තු හා ක්ෂයවීම්

ඉන්ධන, ලිහිසි තෙල් හා රථවාහන නඩත්තු		5,251,490
රක්ෂණය - රථවාහන	336,033	
ඉන්ධන ගාස්තු	1,784,462	
රථ වහාන අලුත්වැඩියාව හා නඩත්තු	1,224,367	
රථවාහාන බලපත්‍ර	57,120	
මිලට ගැනීම - මොටර් රථ අමතර කොටස්	189,792	
නඩත්තු	2,063,649	2,930,222
ක්ෂයවීම් (සටහන 11)	17,179,605	22,293,932
	22,835,028	30,475,643

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2020.12.31 දිනට අවසන් වර්ෂයේ

ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 09

ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවාවන්	2020 රු.	2019 රු.
ප්‍රවාහනය	103,271	119,719
සම්බන්ධතා	1,365,084	2,196,781
අවශ්‍යතා		
අභ්‍යන්තර පාවිච්චිය	60,950	67,061
සුභසාධක වියදම්	2,055,483	2,856,366
සේවක බඳවා ගැනීම් හා පුහුණුව	21,370	2,689,691
ජල බිල්පත්	178,238	280,267
සාකච්ඡා හා සම්මන්ත්‍රන	118,600	567,036
චිත්‍රපට සංරක්ෂණය	651,527	285,085
වරිපනම් බඳු	829,313	829,313
සිනමා කෞතුකාගාර ගිණුම	-	16,463
වෙනත් සේවා		
අධ්‍යක්ෂක මණ්ඩල වියදම් හා විගණන කමිටු වියදම්	783,746	1,249,804
ප්‍රචාරණය	462,235	443,757
විශේෂ නියෝජිත ආයතන	303,529	182,644
විනය පරීක්ෂණ ගාස්තු	199,900	-
නීති ගාස්තු	1,440,916	895,762
සංස්ථා උත්සව	608,860	1,372,811
විගණන ගාස්තු	1,104,000	700,000
ආරක්ෂක සේවා	6,131,460	4,982,550
බැංකු ගාස්තු	65,698	139,028
සිනමා අධ්‍යාපන ඩිප්ලෝමාව	472,579	774,110
පිටස්තර මරණාධාර හා සිනමා ශිල්පීය වියදම්	668,000	968,050
නව සිනමාහලේ වියදම්	353,155	192,515
තිර පිටපත් කියවීම	34,500	21,000
ප්‍රමාද ගාස්තු	22,451	16,034
සනිපාරක්ෂක සේවා	3,363,377	5,555,388
සේවක ණය පොලී පිරිවැය	-	1,552,869
(-) සේවක ණය පොලී ආදායම	-	(1,552,869)
චිත්‍රපට වර්ගීකරණ වියදම්	345,500	608,519
ජනාධිපති සම්මාන උළෙල	-	26,172,934
විමර්ශන නිලධාරී- ගෙවීම්	337,200	190,500
5.1 ශබ්ද පද්ධතිය පිහිටුවීම - චිත්‍රාගාරය (2.3.6)	857,050	
	22,937,991	54,373,187
ජනාධිපති සම්මාන උළෙල වියදම් ප්‍රතිපූර්ණය	-	(20,000,000)
ජනාධිපති සම්මාන උළෙල වියදම් භාණ්ඩාගාර ණය මගින් හිලව් කිරීම	-	(5,000,000)
	22,937,991	29,373,187

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 10 **වෙනත් ආදායම්**	**2020** රු.	**2019** රු.
ලාභාංශ ආදායම	-	39,697
නිෂ්පාදන ණය පොලී	-	5,761
සේවක ණය පොලී	878,888	499,137
විවිධ ආදායම්	90,510	867,346
පිටස්තර රූගත කිරීම්	3,577,857	3,772,713
තත්ත්ව පරීක්ෂා	4,000	85,039
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලී	20,402,036.85	27,615,541
චිත්‍රපට ලියාපදිංචි ගාස්තු - දේශීය විදේශීය	480,000	1,165,930
එන්.එෆ්.සී. සිනමාහලේ ආදායම	1,448,375	6,613,699
චිත්‍රපට නැරඹීම සඳහා ලැබීම්	-	30,000
තිරපිටපත් සඳහා අනුමැතිය	53,000	35,000
224 ගොඩනැගිලි කුලී ආදායම (2.14.5)	8,880,000	8,238,000
පාඨමාලාවන් සඳහා ලැබීම්	115,000	1,082,500
භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම්	11,492,198	17,021,778
විනිමය අනුපාත ගැලපීම	4,103	(29,613)
දේශන ශාලාවේ කුලී ආදායම්	41,000	67,500
රක්ෂණ සංස්ථාවෙන් ලද වන්දි	50,050	-
ප්‍රචාරක පුවරු	216,375	386,567
වාර්ෂික ලියාපදිංචි ගාස්තු - විදේශ චිත්‍රපට ආනයනකරුවන්	425,000	475,000
වාර්තාමය චිත්‍රපට සඳහා අනුමැතිය	1,308,000	-
විමර්ශන නිළධාරී ලැබීම්	238,500	641,000
	49,704,892	**68,612,595**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2020 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 11 - ස්ථාවර වත්කම්

දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	පිරිවැය	පෙර වර්ෂයේ පිරිවැය වෙනුවෙන් කල ගැලපීම්	වර්ෂය තුල එකතු කිරීම්	පිරිවැය	සමුච්චිත ක්ෂයවීම්	පෙර වර්ෂයේ ක්ෂය වෙනුවෙන් කල ගැලපීම්	වර්ෂය සඳහා ක්ෂයවීම්	සමුච්චිත ක්ෂයවීම්	ශුද්ධ අගය
	2020.01.01			2020.12.31	2020.01.01				2020.12.31
	රු.		රු.	රු.	රු.		රු.	රු.	රු.
01. සින්නක්කර ඉඩම්	174,343,458		-	174,343,458	-		-	-	174,343,458
02. සින්නක්කර ගොඩනැගිලි	149,114,227	(2,060,008)	-	147,054,219	66,789,650	(127,429)	5,754,286	72,416,506	74,637,713
03. සිනමා සංකීර්ණය	122,837,432		-	122,837,432	78,775,659		5,067,024	83,842,683	38,994,749
04. මිනි සිනමා උපකරණ	331,451		-	331,451	331,449		-	331,449	2
05. ලී බඩු , සවි කිරීම් හා වැද්දුම්	24,520,077	(1,376,143)	164,246	23,308,180	17,332,928	(137,614)	856,396	18,051,710	5,256,470
06. කාර්යාලීය උපකරණ	27,835,408	(480,000)	1,544,706	28,900,114	18,952,805	(48,000)	1,412,922	20,317,727	8,582,388
07. මෝටර් රථ	18,182,879		-	18,182,879	12,782,877		2,700,000	15,482,877	2,700,002
08. චිත්‍රපට සංරක්ෂණය	2,104,455		-	2,104,455	1,403,583		146,659	1,550,242	554,213
09. පාපැදි	18,281		-	18,281	18,277		-	18,277	4
10. චිත්‍රපට උපකරණ	910,689		-	910,689	812,110		49,280	861,390	49,299
11. ප්‍රක්ෂේපණ උපකරණ	925,202		232,950	1,158,152	654,148		71,848	725,996	432,156
12. චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර	97,995,676		1,043,296	99,038,972	91,477,284		1,044,415	92,521,699	6,517,273
13. සිනමා අධ්‍යාපන උපකරණ	1,241,350		-	1,241,350	1,036,948		75,204	1,112,152	129,198
14. සුභසාධන උපකරන	210,677		-	210,677	199,675		1,572	201,246	9,430
	620,571,262	**(3,916,151)**	**2,985,198**	**619,640,309**	**290,567,392**	**(313,044)**	**17,179,605**	**307,433,953**	**312,206,356**
නොනිමි කාර්‍ය (2.4)									
ගොඩනැගිලි	2,060,008		13,803,673	15,863,681					15,863,681
වායු සමීකරණ	1,376,143		5,773,068	7,149,211					7,149,211
	3,436,151	**-**	**19,576,741**	**23,012,892**	**-**	**-**	**-**	**-**	**23,012,892**
මුළු වත්කම්	**624,007,413**	**(3,916,151)**	**22,561,939**	**642,653,201**	**290,567,392**	**(313,044)**	**17,179,605**	**307,433,953**	**335,219,247**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

		2020	2019
		රු.	රු.
සටහන : 12			
දිගු කාලීන ආයෝජන			
ස්ථාවර තැන්පතු (සටහන 2.2.8)		26,610,169	23,463,724
කොටස් ආයෝජනය-සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම		127,000	127,000
		26,737,169	23,590,724
සටහන : 13			
කෙටි කාලීන ආයෝජන			
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක		5,000	5,000
රිපෝ තැන්පතු		93,345,868	201,624,456
භාණ්ඩාගාර බිල්පත්		108,524,164	113,601,156
		201,875,032	315,230,612
සටහන : 14			
තොග			
චිත්‍රපට		5,253,887	5,253,887
වෙළඳ කටයුතු		4,926,733	4,349,983
චිත්‍රාගාරය		1,697,363	1,697,363
චිත්‍රාගාරය නඩත්තු අමතර කොටස්		1,472,575	1,472,575
ලිපි ද්‍රව්‍යය හා වෙනත්		2,331,013	2,126,924
		15,681,571	14,900,732
සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම්		(8,597,176)	(8,597,176)
		7,084,395	6,303,556
සටහන : 15			
ණයගැතියෝ			
සිනමාහල්	362,737,356		
(-) අධිභාර වෙන් කිරීම්	(155,454,663)		
(-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම 16ඒ	(111,636,986)	95,645,707	101,616,033
නිෂ්පාදකයෝ	83,876,799		
(-) නිෂ්පාදන ණය පොලි වෙන් කිරීම්	(4,618,806)		
(-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම 16ඒ	(63,494,617)	15,763,375	15,471,488
		111,409,083	117,087,522
සටහන : 16			
විවිධ ණයගැතියෝ			
වෙනත්		177,054,722	175,766,202
විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම(සටහන 16 ඒ)		(8,852,736)	(8,788,310)
සේවක අත්තිකාරම්		20,714,077	22,375,488
සේවක ණය වත්කම් ගිණුම		-	1,467,383
(-) සේවක ණය වගකීම් ගිණුම		-	(1,467,383)
		188,916,063	189,353,380

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

අඩමාන ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය

සටහන : 16 ඒ

ණයගැතියෝ	එකතුව 2020	එකඟ නොවූ හා අය කර ගත නොහැකි	අය කර ගත හැකි	5% වෙන් කිරීම්	මුළු වෙන් කිරීම්
	රු.	රු.	රු.	රු.	රු.
සිනමාහල්	362,737,356	98,421,177	264,316,179	13,215,809	111,636,986
නිෂ්පාදකයන්	83,876,799	62,421,871	21,454,928	1,072,746	63,494,617
වෙනත්	177,054,722		177,054,722	8,852,736	8,852,736
සේවක ණය	19,532,289	-	19,532,289	-	-
	643,201,165	**160,843,048**	**482,358,117**	**23,141,291**	**183,984,339**

		සිනමාහල්	නිෂ්පාදකයන්	වෙනත්
ශේෂය ඉ / ගෙ	183,870,850	111,603,285	63,479,255	8,788,310
ලාභාලාභ ගිණුමට මාරු කළා	113,490	33,701	15,362	64,426
	183,984,339	**111,636,986**	**63,494,617**	**8,852,736**

ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම්

2020.01.01 දිනට	183,870,850
ලාභාලාභ ගිණුමට මාරු කළා	113,490
ශේෂය ප/ගෙ 2020.12.31	**183,984,339**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2020	2019
	රු.	රු.
සටහන : 17		
තැන්පතු හා ඉදිරියට ගෙවීම්		
තැන්පතු	3,851,112	3,792,893
අත්තිකාරම් ගෙවීම්	204,407	492,508
සුබ සාධක සංගමයට මරණාධාර අත්තිකාරම්	17,158	-
	4,072,676	4,285,401
නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම	(653,728)	(653,728)
	3,418,948	3,631,673
සටහන : 18		
මුදල් හා බැංකු ශේෂ		
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647	188,442	874,707
මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533	756,913	1,530,032
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664	917,929	3,420,112
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272	4,362,273	(241,062)
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131	786,200	792,846
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354	6,085,060	4,328,874
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363	1,334,998	11,035,364
ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189	8,598,724	763,288
ලංකා බැංකුව - ජ. ගි. අ. 5152460	-	976,303
	23,030,540	23,480,463
අත ඉතිරි මුදල්		
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය	-	36,134
සුළු මුදල් - චිත්‍රාගාරය	25,000	24,970
සුළු මුදල් - චිත්‍රපට ගබඩාව	34	34
	25,034	61,138
මාස 03ට කල් පිරෙන තැන්පතු		
රිපෝ තැන්පතු	112,074,307	
භාණ්ඩාගාර බිල්පත්	9,615,868	
	121,690,175	-
එකතුව	144,745,749	23,541,601
සටහන : 19		
පුදානයන්		
භාණ්ඩාගාර ප්‍රදානයන්	102,160,132	104,181,910
(-)ක්‍රමක්ෂය	(11,492,198)	(17,021,778)
	90,667,934	87,160,132

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

		2020	2019
		රු.	රු.
සටහන : 20			
පාරිතෝෂික වෙන් කිරීම්			
ඉදිරියට ගෙනා ශේෂය - 2020.01.01		42,365,554	43,151,056
2018 වර්ෂයේ ඌන වෙන් කිරීම		-	497,151
වර්ෂය සඳහා වෙන් කිරීම්		12,457,075	3,486,140
මුදල් ගෙවීම්		(3,486,995)	(4,768,794)
		51,335,633	42,365,554

(භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත.)

සටහන : 21			
තැන්පතු			
එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු		375,272	430,272
ආපනශාලා තැන්පතු		30,000	35,000
ආරක්ෂක තැන්පතු -	සිනමාශාලා	2,326,727	2,573,754
	සේවක	5,000	5,000
	චිත්‍රපට ආනයන	7,500	7,500
	සිනමා ව්‍යාපෘතිය	45,000	45,000
	ඝනිපාරක්ෂක සේවා	160,000	160,000
		2,949,499	3,256,525

සටහන : 22		
චිත්‍රපට කුලී ණයහිමියෝ		
චිත්‍රපට කුලී ණයහිමියෝ	251,888,838	269,193,607
(-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම	(18,046,804)	(18,046,804)
	233,842,034	251,146,803

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 23	2020 රු.	2019 රු.
වෙනත් ණයහිමියෝ		
උපචිත වියදම් (2.10)	51,097,862	46,297,558
ගෙවිය යුතු එකතු කල අගය මත බදු	152,612	152,612
විගණන ගාස්තු ප්‍රතිපාදන	5,125,000	3,215,795
දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර)	47,723	55,848
හිමිකම් නොපෑවේතන	946,911	947,611
සේවක අර්ථසාධක අරමුදල	656,759	1,901,241
සේවක භාරකාර අරමුදල	72,955	242,662
විවිධ ණයහිමියෝ	853,954	1,429,773
(-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම්	(644,840)	(644,840)
ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල (2.11)	3,525,795	3,697,545
රිත්මා මණ්ඩල පාලන ගිණුම	4,656,588	5,316,841
උපයන විට බදු ගෙවීම	38,253	38,253
වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම	577,190	577,190
ලැබිය යුතු නිෂ්පාදන ණය පොලී වෙන් කිරීම	1,028,122	1,028,122
ප්‍රසිද්ධ රුගුම් පාලක මණ්ඩලය	114,801	114,801
චිත්‍රපට කළාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් පාලන ගිණුම	2,618,552	-
චිත්‍රපට ප්‍රතිශ්ඨාපනය	-	(485,692)
සිලොන් බිසකට් සමාගම	976,303	976,303
	71,844,541	64,861,624

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. CAA/B/SNFC/28/2020/FA

මබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 දෙසැම්බර් 06 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 66 වන ඡේදය ප්‍රකාරව මාස 12 ක් ඇතුළත ලැබිය යුතු සේවක ණය මුදල් ජංගම වත්කම් ලෙසත්, මාස 12 කට වැඩි කාලයකින් පසුව අයවීමට ඇති වටිනාකම් ජංගම නොවන වත්කම් ලෙසත්, වර්ගීකරණය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කළ යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.19,532,289 ක් වූ සේවක ණය වර්ගීකරණය කිරීමකින් තොරව ජංගම වත්කම් ලෙස සටහන් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 69 වන ඡේදය ප්‍රකාරව සේවක පාරිතෝෂික වෙන් කිරීමේදී ඉදිරි මාස 12 ක කාලය තුළ ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම් ජංගම වගකීම් ලෙසත්, ඉතිරි පාරිතෝෂික ගෙවීම් වටිනාකම් ජංගම නොවන වගකීම් ලෙසත් පෙන්විය යුතු වුවත්, එසේ වර්ගීකරණයකින් තොරව මුළු වෙන් කිරීම් වන එකතුව රු.51,335,633 ක වටිනාකම් ජංගම නොවන වගකීම් ලෙස සටහන් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු අගයන් සහ මූල්‍ය වගකීම් වෙන් වෙන්ව පෙන්විය යුතු වුවත්, සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ එකතුව රු.51,097,862 ක් වූ මූල්‍ය වගකීම් වන උපචිත වියදම් වෙනත් ණයහිමියන් යටතේ සටහන් කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 54 ඡේදය ප්‍රකාරව ප්‍රතිපාදන වෙන්කිරීම් හා ගෙවිය යුතු බදු මුදල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ වෙනම හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාව විසින් ගෙවිය යුතු එකතු කළ අගය මත බදු එකතුව රු.152,612 ක් සහ උපයන විට ගෙවීම් බදු එකතුව රු.38,253 ක් හා විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන එකතුව රු.5,125,000 ක් වෙනත් ණයහිමියන් යටතේ සටහන් කර මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 07 වන ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රති විකුණුම් බිල්පත් ගිණුම්ගත කිරීමේදී 2020 දෙසැම්බර් 31 දිනට කල් පිරීමට ඉතිරිව ඇති කාලය මාස 03 හෝ ඊට අඩු ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන ද්‍රවශීල වත්කම් ලෙස පෙන්නුම් කළ යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දිනට මාස තුනක කාලයක් තුළදී කල් පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් 26 ක එකතු වටිනාකම් වූ රු.118,997,660 ක් හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රති විකුණුම් (Repo) 11 ක එකතු වටිනාකම් වූ රු.108,680,741.10 ක් මුදල් හා මුදල් සමාන ද්‍රවශීල වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ඊ) 2020 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූල නොවන ලෙස 2019 සහ 2020 වර්ෂවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල අයිතම්වල වටිනාකම් අතර වෙනස්කම් පදනම් කර ගනිමින් සංස්ථාවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි. ඒ අනුව සත්‍ය මුදල් ගලා ඒමක් සහ මුදල් ගලා යාම් පදනම් කරගෙන අවශ්‍ය ගැළපීම් සහිතව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර නොතිබුණි. තවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී මහාභාණ්ඩාගාර ලැබීම් තුළින් ජනනය වූ එකතුව රු.105,000,000 ක මුදල් ප්‍රවාහය, මූලාන්න ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු වුවත්, එය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ප්‍රවාහයක් ලෙස සටහන් කර තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 79 (අ) ඡේදය ප්‍රකාරව නිශ්කාර්යතා වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොත් අගයට හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථා පරිශ්‍රය තුළ හා ඉන් පිටත සංස්ථාවට අයත් ගොඩනැගිලි තුළ පවතින නිශ්කාර්යතා වත්කම් හා යල් පැන ගිය පැරණි වත්කම් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 ප්‍රකාරව ඇති විය හැකි අසම්භාව්‍ය වගකීම් සම්බන්ධව සහ නඩු පරීක්ෂණ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට සහ ඒ සඳහා වන වෙන් කිරීම් කිරීම් පිළිබඳව හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට විවිධ අධිකරණවල විභාග වෙමින් පවතින සංස්ථාව චිත්තිකරු වූ නඩු කටයුතු 09 ක් ද, කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික ආරවුල් පනත යටතේ පවතින පරීක්ෂණ 05 ක් ද, මානව හිමිකම් කොමිෂන් සභාවේ පවතික පරීක්ෂණ 09 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 හි 68 (අ) ඡේදය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වියදමක් ලෙස හඳුනා නොගත යුතු අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ස්ථාවර වත්කම් යටතේ දිගුකාලීන වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් අනතුරුව ඒවායේ ඵලදායී ජීව කාලය තක්සේරු කර, වාර්ෂිකව ක්‍රමක්ෂය සිදුකර ඒ අනුව ආදායම් ප්‍රකාශනයට වියදම් හඳුනාගත යුතු වුවත්, එකතුව රු.6,587,305 ක් වූ අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) 2020 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ චිත්‍රපට තුළි ණයගැනි විස්තරාත්මක උපලේඛනය අනුව ණය ශේෂය රු.381.558.535 ක් වුවත්. එදිනට ප්‍රධාන ලෙජරයේ චිත්‍රපට තුළි ණයගැනි පාලන ගිණුම අනුව ශේෂය රු.362.737.356 ක් වීම නිසා රු.18.821.178 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) සංස්ථාවේ ආදායම් වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම මත 2011 වර්ෂයේ සිට මහාභාණ්ඩාගාරයෙන් සේවක වැටුප් හා ප්‍රාග්ධන වැය සඳහා ප්‍රතිපාදන සලසාදී තිබුණි. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක කාලය තුළ සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබන තත්ත්වයක් නිරීක්ෂණය විය. වර්තමානය වන විට රජයේ මූල්‍ය සහයක් හෝ චිත්‍රපට බෙදාහැරීමේ සහ කේෂ්ත්‍ර නියාමන බලතල සංස්ථාව වෙත ලබා ගැනීමේ නීතිමය කටයුතු සාක්ෂාත් කර ගැනීමකින් හෝ තොරව සංස්ථාව අබන්ධව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මූලය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් චිත්‍රපට සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්.

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් චිත්‍රපට සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අවබෝධයන් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඇ), (ඉ) සහ (ඕ) යන නිරීක්ෂණ හැර ඉකුත් වසරේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13 වන වගන්තිය, VII වන පරිච්ඡේදයේ 12.2.3 සහ 12.2.6 වන වගන්ති සහ 2003 ජූනි 02 දිනැති පිරීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ අංක 9.3.1 හි VI, VII සහ VIII දරන වගන්ති.	සමාලෝචිත වර්ෂය වන විට සංස්ථාවේ තනතුරු 57 ක පුරප්පාඩු පැවති අතර, එම තනතුරු සඳහා ස්ථිරව පත්වීම් ලබාදීම් වෙනුවට වැඩබැලීමේ සහ වෙනත් විවිධ පදනම් මත එම තනතුරු වලින් තනතුරු 14 ක් සම්පූර්ණ කර තිබුණි. පුරප්පාඩු පිරවීමට අනුප්‍රාප්තික සැලසුම්ද සකස් කර නොතිබුණු අතර, මෙම තනතුරු සඳහා දිගුකාලයක සිට ස්ථිරව සේවකයින් පත්කිරීම් සිදු කර නොතිබුණි.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2006 ජනවාරි 25 දිනැති ජා.ප්‍ර.නි. වක්‍රලේඛ අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය භාවිතා කිරීමකින් තොරව එකතු වටිනාකම රු.99,965,061 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් 2019 අප්‍රේල් 05 දින සංස්ථාව විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ප්‍රදානය කර තිබුණි. ඒ සඳහා දෙපාර්ශවය අතර අත්සන් කළ ද්විපාර්ශවික ගිවිසුම මත පදනම්ව 2020 අගෝස්තු 28 දින එකතුව රු.3,134,107 ක් ප්‍රසම්පාදන ක්‍රමවේදයට පරිභාහිරව තෝරාගත් කොන්ත්‍රාත්කරු වූ රාජ්‍ය සංස්ථාවක් වෙත ගෙවීම් කර තිබූ අතර, මේ දක්වාම මෙම ඉදිකිරීම් අතරමඟ නතර කර දමා තිබුණි.

(ආ) සංස්ථාවට අයත් "තරංගනී" සිනමාශාලාව සඳහා 4K ප්‍රොජෙක්ටරයක් එකතුව රු.11,460,155 ක් ගෙවා මිලදිගෙන තිබුණි. මෙම මිලදී ගැනීමට අදාළ ලිපිගොනු විධිමත්ව හා විනිවිද භාවයකින් යුතුව පවත්වාගෙන ගොස් නොතිබූ අතර, එම මිලදී ගැනීම 2006 ජනවාරි 25 දිනැති ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සිදු කර නොතිබුණි. 2020/ 2021 වර්ෂ වන විට සංස්ථාවට අයත් "තරංගනී" සිනමාශාලාවේ භාවිතය සඳහා සවිකර තිබූ මෙම ප්‍රොජෙක්ටරය සවි කිරීමෙන් පසුව අවස්ථා කීපයකදී අක්‍රිය වී තිබූ අතර, වර්තමානය වන විටද එය ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි.

2.3. වෙනත් කරුණු

(අ) 2021 ජූලි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා කමිටු රැස්වීම් වාර්තාව ප්‍රකාරව 2021 අගෝස්තු 05 දින "කෝප්" කමිටුව මඟින් අංක COPE/9/1/2020 දරන ලිපිය සමඟ කමිටු නියෝග 14 ක් සංස්ථාව වෙත යොමු කර තිබුණි. නිශ්චිත කාල වකවානු සඳහන් කරමින් ලබාදී තිබූ එම නියෝග වලට අනුකූලව පවරන ලද කාර්යයන් 10 ක් මෙම වාර්තාවේ දින දක්වා නිම කර එහි සඳහන් උපදෙස් ප්‍රකාරව කෝප් කමිටුව වෙත සහ විගණකාධිපතිවරයා වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) උසස් ශ්‍රී ලංකේය සිනමා සංස්කෘතියක් බිහි කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ශාස්ත්‍රීය. සංකල්පීය සහ තාක්ෂණික පදනමක් සකස් කිරීමේ අරමුණු පෙරදැරි කරගෙන සිනමාකරණය පිළිබඳ එක් අවුරුදු "ඩිප්ලෝමා පාඨමාලාවක්" ආරම්භ කර තිබුණි. අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වන මෙම පාඨමාලාව සඳහා 2020 වර්ෂයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 50 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද. සිසුන් බඳවාගෙන නොතිබුණි. යල්පැන ගිය උපකරණ භාවිතා කිරීමත්, තාක්ෂණික උපකරණ ප්‍රමාණවත් නොවීමත්, නවීන ශ්‍රවනාගාර පහසුකම් නොමැති වීම මත පාඨමාලාවට අයදුම් කරන සංඛ්‍යාව පහළ ගොස් තිබූ අතර. 2016 වසරේ සිට 2020 දෙසැම්බර් දක්වා වූ වර්ෂ 05 තුළ සිසුන් 94 දෙනෙකු බඳවාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශිෂ්‍යයින් 22 දෙනෙකු එනම්, සියයට 23 ක් පමණක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි.

(ඇ) 2019 වර්ෂයේදී ගිණුම් තැබීම පරිගණක මඟින් සිදු කිරීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව "ක්වික් බුක්" (Quick Book) මෘදුකාංග පද්ධතිය සංස්ථාව විසින් මිලදී ගෙන තිබුණි. ආයතනය තුළ තොරතුරු තාක්ෂණ අංශයක් හා පුහුණු සේවකයින් නොමැති අතර, විධිමත් අභ්‍යන්තර පාලන පද්ධති උපක්‍රමද හඳුන්වා දී නොතිබුණි. පරිගණකගත ගිණුම්කරණ පද්ධතියට සමගාමීව ලෙජර් පොත් පත් අතින් ලියා සැකසීම 2020 වර්ෂයේ සිටම නතර කර දමා තිබූ අතර, 2021 ඔක්තෝම්බර් මස වන විටද 2019 ගිණුම් වසරට අදාළව සංඛ්‍යා දත්ත එම පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමට හා ඉවත් කිරීමට එහි පැවති විශේෂ හැකියාව නිසා ලබා ගන්නා දත්ත හා තොරතුරු වල විශ්වාසනීයත්වය පිළිබඳ ගැටළු ඇති වී තිබුණි. තවද, දත්ත වල අමතර පිටපත් (Backup) ආරක්ෂිතව තබා නොගැනීමත්, අවශ්‍ය විටක ඒවා යළි පද්ධතියට ඇතුල් කළ නොහැකි වීමත්, පද්ධතිය සඳහා කාර්යක්ෂම දෘඩාංග ලබා නොගැනීමත්, අභ්‍යන්තර හා බාහිර විගණන අංශ වෙත පද්ධතියට පිවිසීමට අවස්ථාව සීමා වීමත් මත පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය අවදානම් තත්ත්වයක පැවතුණි.

(ඈ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කළ අංක:DMS/360/NFC/P හා 1999 ජූනි 17 දිනැති "ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශය" ප්‍රකාරව (නීලචිර වාර්තාව) සංස්ථාව සතුව තිබූ චිත්‍රපට බෙදා හැරීමේ ඒකාධිකාරී බලය පෞද්ගලික බෙදාහැරීමේ මණ්ඩල 04 ක් වෙත පවරා දී තිබුණි. එම මණ්ඩල චිත්‍රපට බෙදා හැරීමේ ක්‍රමවේදය සාධාරණ ලෙස සිදු නොකිරීම නිසා 2020 මාර්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 20/0581/205/019 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් "නීලචිර වාර්තාව" අහෝසි කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. එම තීරණයට පෞද්ගලික මණ්ඩල විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ගයන් නිසා සංස්ථාව විසින් සකස් කළ "චිත්‍රපට බෙදා හැරීම සහ ප්‍රදර්ශනයට අදාල ක්‍රමවේදය" විධිමත්ව කැබිනට් අනුමැතියක් සඳහා යොමු කර තිබූ අතර. එම බෙදා හැරීම හා ප්‍රදර්ශනයට අදාල ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 ජූනි 14 දිනැති අංක:අමප/21/1024/305/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. එම අනුමැතිය ප්‍රකාරව එහි සඳහන් කරුණු මේ දක්වා ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු නොකිරීම නිසා සංස්ථාවේ ක්‍රියාකාරිත්වයට සහ චිත්‍රපට කර්මාන්තයේ අභිවෘධියට අයහපත් ලෙස බලපෑම් ඇති කර තිබුණි.

(ඉ) සංස්ථාවට අයත් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි තනි මහල් ගොඩනැගිල්ල 2007 වර්ෂයේ සිටම ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය වෙත බදු කුළී පදනමට ලබාදී තිබුණි. දෙපාර්ශවය අතර අවසන් වරට 2017 ජනවාරි 23 දින අත්සන් කළ අංක 4711 දරන බදු ගිවිසුම 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. රැගුම් පාලක මණ්ඩලය විසින් එම බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි කඩකරමින් ගොඩනැගිල්ල කඩා ඉවත් කර වර්ග අඩි 2576 ක නව

දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එම නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ මූලික වැඩ 2016 මැයි 17 දින ආරම්භ කර තිබූ නමුත්, මේ දක්වාම ඉදිකිරීම් වැඩ නිම කර නොතිබුණි. විධිමත් ලිඛිත ගිවිසුමක් රහිතව රැගුම් පාලක මණ්ඩලය විසින් ඉදිකළ මෙම නව ගොඩනැගිල්ල සඳහා වන විදුලිය හා ජල බිල්පත් ඔවුන් විසින්ම තම ආයතනයේ නමින් ගෙවීම් කරමින් ගොඩනැගිල්ල පරිහරණය කරනු ලබන බව නිරීක්ෂණය විය. ගිවිසුම අවලංගු වී වසර 02 කුත් මාස 10 ක් ගතවී ඇතත්, නව ගොඩනැගිල්ල සඳහා රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන නව බදු කුළිය තක්සේරු කර විධිමත් බදු ගිවිසුමකට එළඹීමට සහ හිඟ මුදල් අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඊ) සංස්ථාවට අයත් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහළ අංක 4660 දරන බදු ගිවිසුම ප්‍රකාරව 2019 ජනවාරි 14 දින දක්වා මසකට රු.315,000 ක බදු කුළී පදනමක් මත සංස්ථාව විසින් සැලසිනේ රූපවාහිනී ආයතනය වෙත ලබාදී තිබුණි. සිනමා පාසලක් පිහිටුවීමට 2021 දෙසැම්බර් 21 දිනැති අංක 1195 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව එන්තරවාසියක් යොමු කර සැලසිනේ ආයතනය ගොඩනැගිල්ලෙන් ඉවත් කිරීමට තීරණය කර තිබුණි. සැලසිනේ ආයතනය විසින් මේ දක්වා සංස්ථාවට අයවිය යුතු හිඟ බදු කුළිය, ජල හා විදුලි බිල්පත් එකතු වටිනාකම රු.4,111,810 ක් විය. සිනමා පාසලක් ආරම්භ කිරීමට යෝජිත මෙම ගොඩනැගිල්ල මෙම වාර්තාවේ දින දක්වා සංස්ථාව වෙත භාර දීමට කටයුතු කර නොතිබුණි.

(උ) අයවිය යුතු හිඟ ණය ශේෂ වාර්තාව අනුව 2020 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදනයට සහ සිනමාශාලා නවීකරණය සඳහා සංස්ථාව විසින් ලබාදී ඇති අයකර නොගත් මුළු හිඟ හිටි එකතු වටිනාකම රු.85,174,055 ක් විය. එම වටිනාකම තුළ ප්‍රදර්ශනය සඳහා මුදා නොහළ චිත්‍රපට සඳහා ලබාදී තිබූ අයකළ නොහැකි එකතුව රු.23,983,079 ක මුදලක් ද විය. ඒ අනුව චිත්‍රපට නිෂ්පාදනය, සිනමාශාලා නවීකරණය සහ වර්ග නොකළ නිෂ්පාදන ණයගැතියන් සඳහා ලබාදී තිබූ එකතුව රු.85,174,055 ක වටිනාකමින් එකතුව රු.72,712,671 ක් එනම් සියයට 85.4 ක් අයකරගත නොහැකි හිඟ ණය සහ පොළී මුදල් බව නිරීක්ෂණය වූ අතර, එම මුදල් අයකර ගැනීමට දිගු කාලයක සිට අපොහොසත් වී තිබුණි.

(ඌ) 2001 වර්ෂයේදී සිනමාහල් මණ්ඩල වලට බෙදී යාමේදී කිසිදු මණ්ඩලයකට අදාළ නොකර, වසා දමන ලද සිනමාශාලා 137 කින් 2020 දෙසැම්බර් 31 දිනටද අයවිය යුතු වර්ෂ 19 කට වඩා පැරණි හිඟ මුදල් එකතු වටිනාකම රු.7,659,366 ක් විය. තවද, මණ්ඩල වලට බෙදීමෙන් පසුව 2020 දෙසැම්බර් 31 දක්වා වසා දමන ලද සිනමාශාලා වලට අදාළව අයවිය යුතු මුළු හිඟ මුදල් එකතු වටිනාකම රු.138,022,871 ක් වූ අතර, ඒ අනුව එකතුව රු.145,802,930 ක් වසා දමන ලද සියළු සිනමාශාලා වලින් අයකර ගත නොහැකිව හිඟව පැවතුණි.

(එ) 2020 දෙසැම්බර් 31 දිනට සියළුම සිනමා ප්‍රදර්ශන මණ්ඩල වලට අයත්ව ක්‍රියාත්මක වන සිනමාශාලා වලින් අයවිය යුතු මුළු ණය හා පොළී මුදල් එකතුව රු.241,538,242 ක් විය. එම මුදලින් එකතුව රු.136,881,529 ක් පොළී මුදල වන අතර, එකතුව රු.104,656,713 ක් හිඟ මුදල් විය. එකතුව රු.241,538,242 ක් වූ මුළු වටිනාකමින් එකතුව රු.142,046,109 ක් එනම්. සියයට 58 ක් අයකරගත නොහැකි හිඟ මුදල් හා පොළී වන බව ණය වාර්තාව අනුව නිරීක්ෂණය විය.

(ඒ) සේවක ණය අත්තිකාරම් ගෙවීම් හා අයකර ගැනීම සම්බන්ධයෙන් වූ පද්ධතියෙහි වූ පාලන දුර්වලතාවයන් නිසා 2020 දෙසැම්බර් 31 දිනට හඳුනාගත නොහැකිවූ ණය අත්තිකාරම් ශේෂය රු.539,222 ක් විය. තවද, වර්ෂ 05 ඉක්ම වූ අයකර නොගත් ණය අත්තිකාරම් රු.531.420 ක්ද, අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඔ) 2006 ජනවාරි මස සිට 2015 දෙසැම්බර් මස දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ජීවන වියදම් දීමනාව නොසලකා සේවක අර්ථ සාධක හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් ගණනය කර ගෙවීම නිසා එම අරමුදල් සඳහා පිළිවෙලින් රු.20,352.762 ක් සහ රු.2,763,752 ක් අඩුවෙන් දායක මුදල් ගෙවීම් කර තිබුණි. එම හිඟදායක මුදල් යළි ගෙවීමේදී ඒ සඳහා අධිභාර මුදල්ද ගෙවීමට සිදුවී තිබූ අතර, හිඟ මුදල් ගෙවීම සඳහා 2020 ඔක්තෝම්බර් 21 දින පැවති 1193 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එකඟතාවය ලබා දී තිබුණි. ඒ අනුව එකතුව රු.34,674,771 ක් වූ මෙම අධිභාර හා දායක මුදල් 2021 ජූනි 28 දින වන විට ගෙවා අවසන් කර තිබූ අතර, ඒ අනුව අධිභාර ලෙස එකතුව රු.11,558,257 ක් වූ අනාර්ථික වියදමක් සංස්ථාවට දැරීමට සිදු වී තිබුණි.

(ඔ) 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද, සංස්ථාව විසින් ජංගම ගිණුම් 08 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර, එදිනට එම ජංගම ගිණුම්වල මුදල් පොත අනුව එකතුව රු.23,030,540 ක වාසිදායක බැංකු ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි. ඒ අනුව එකතුව රු.මිලියන 23 ක් පමණ මුදලක් වූ සංස්ථාව සතු මුදල් නිශ්කාර්යාව රඳවා තබා ගැනීම මූල්‍ය කළමනාකරණයේ අකාර්යක්ෂමතාවයක් බව නිරීක්ෂණය විය.

(ක) ආචාර්ය "ලෙස්ටර් ජේම්ස් පීරිස්" මහතා නමින් සංස්ථා පරිශ්‍රය තුළ කෞතුකාගාරයක් හා පුස්තකාලයක් ඉදිකිරීමේදී එහි ඉදිකිරීම් සහ උපදේශනාත්මක කටයුතු ඇස්තමේන්තුගත වටිනාකම රු.99,965,061 කට සංස්ථාව විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරාදීමට ද්විපාර්ශවික ගිවිසුමකට එළඹ, 2019 අප්‍රේල් 05 දින එම ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකරන භූමිය සඳහා සංස්ථාව නමින් ඔප්පුවක් නොතිබූ අතර, එම ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියද ලබාගෙන නොතිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ද රහිතව ආරම්භ කළ මෙම ඉදිකිරීම් වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.3,134,107 ක ගෙවීම් කර තිබූ අතර, වසර 02 ක පමණ කාලයක සිට මෙම ඉදිකිරීම් කටයුතු අතහැර දමා ගොඩනැගිල්ල විනාශයට භාජනය වෙමින් තිබුණි.

(ග) සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 03 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වැඩබැලීමේ/ රාජකාරී ඉටු කිරීමේ යන පදනමක් මත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් තිදෙනෙකු පත් කර තිබුණි. එම පත් කළ නිලධාරීන්ගේ පැමිණිම හා පිටවීම, ඇඟිලි සළකුණු යන්ත්‍රයක් භාවිතා කර තහවුරු කර ගැනීමකින් තොරව වැටුප් හා අනෙකුත් දීමනා වශයෙන් එකතුව රු.3,098,046 ක් ගෙවීම් කර තිබුණි.

ඩබ්ලිව්.පී.ඒ.වික්‍රමරත්න
විගණකාධිපති



ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்

NATIONAL FILM CORPORATION OF SRI LANKA